# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk
ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ මැදින් අව අටවක පෝදා 2023 මාර්තු 15 බදාදා BUDUSARANA WEDNESDAY MARCH 15, 2023
ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 38 පත්‍රය , ආරම්භය 1965 - 06 - 13



ඡායාරූපය -
වාසිත පටබැඳිගේ



# අන්ධානුකරණය තමන්ගේම විනාශයට අත වැනීමකි

**බොහෝ දෙනා තමන් නොදන්නා බව අනාවරණය කිරීමට මැළිකමක් දක්වති. එහෙත් තමන් තුළින් හරි වැරැද්ද අවබෝධ කර ගෙන නිවැරැදි මාර්ගයට ප්‍රවිෂ්ට වන්නේ නම්, ඔහු ප්‍රඥාවන්තයෙකි.**

වැරැද්ද නොදකින පුද්ගලයාට වඩා ඔහු ගුණ යහපත් අයෙකි. වැරැද්ද දකින පුද්ගලයාට පමණයි වැරැද්ද නිවැරැදි කර ගැනීමට හැකියාව ඇත්තේ. මොහු අවංක පුද්ගලයෙකි, නිහතමානී අයෙකි. ඔහුගේ අනාගතය ආලෝකවත් වීමේ ලක්ෂණයන් ඉස්මතුව පෙනෙන්නේ ය.

තමන් දන්නා බව නොදන්නා ගති ලක්ෂණ ඇති අයත් අද ගිහි පැවිදි අප අතර ජීවත්ව සිටිති. මෙම පුද්ගලයාගෙන් සමාජයට වන හානිය ප්‍රකට නොවුව ද පෞද්ගලිකව ඔහුට විශාල පාඩුවක් විය හැකි ය.

තමන්ගේ දැනුමෙන් තමන්ටත් ප්‍රයෝජනයක් නැති අතර, අනුන්ටත් ප්‍රයෝජනයක් නැත. මෝහය වැනි කෙලෙස් ධර්මයන්ගෙන් ඔහුගේ චිත්ත සන්තානය වැසී ඇත.

මේ නිසා තමන්ගේ දැනුම තමන් තුළ සැඟවී ඇති නිසා යථාර්ථවාදී දැක්මකට ඔහුට යාමට නොහැකි තත්ත්වයක් උදා වී ඇත. එනිසා එම දැනුමෙන් නිසි ප්‍රයෝජන ගැනීමට සිහි නුවණින් යුතුව වීර්ය ගත යුතුව ඇත.

ඔහු තමන් දන්නා බව දන්නා අයෙකි. ඔහු නිවැරැදි දෙය හඳුනාගෙන වැඩ කරන ගුණගරුක අයෙක් වේ. සිත, කය, වචනය සංවර කර ගත් ඔහුගෙන් තමන්ටත් සමාජයටත් සිදුවන්නේ ලාභයකි. ඔහු ලෞකිකව සැප ලබන අතර, ලෝකෝත්තර සැපය උදාකර ගැනීමට ද අවස්ථාව සලසා ගනී. කල්‍යාණ මිත්‍රයකු ලෙස උදාර සමාජ මෙහෙවරක යෙදෙමින් ඔහු විශාල සේවයක් සිදු කරයි. බෞද්ධ දර්ශනයට අනුව උතුම් මනුෂ්‍ය ලාභයක් හිමි කරගත් ඔහු නුවණ, වීර්යය, සිහිය ප්‍රයෝජනයට ගෙන සදාතනික සුවය ළඟා කර ගැනීමට ද වෙහෙසෙන්නේ ය.

මේ අතරින් තමන් කුමන පුද්ගලයකු නියෝජනය කරන්නේ ද යන්න සිහි නුවණින් මනසිකාර කළ යුතුව ඇත. කෙලෙස් එක්දහස් පන්සිය දහයකටත් වැඩි ප්‍රමාණයක් පෘතග්ජන මිනිස් සන්තානය තුළ ක්‍රියාත්මක වන බව රේරුකාණේ චන්දවිමල ස්වාමීන් වහන්සේ පොතක ලියා ඇත. මෙම කෙලෙස් වනය සිඳ බිඳ දැමීම කළ යුතුව ඇත.

ඒ සඳහා බුදුපියාණන් වහන්සේ විසින් අප කෙරෙහි කරුණාවෙන් සරල, එහෙත් ගාම්භීර ප්‍රතිපදාවක් හඳුන්වා දී ඇත. එම ප්‍රතිපදාව අනුගමනය කරන ගිහි පැවිදි සියල්ලන්ට ම යහපත් තැනකට ප්‍රවිෂ්ට විය හැක. ඒ තුළින් තමා කවුද යන්න තමන්ට ම අවබෝධ කළ හැකි ය. ඒ ඒ කෙනා තුළ පවතින කෙලෙස් ධර්මයන්ගේ ස්වභාවය තම තමන්ට අවබෝධ කර ගත හැකි ය.

'සුනාථ, ධාරේථ චරාථ ධම්මේ' යන බුදුපියාණන් වහන්සේගේ අනුශාසනාවට අනුව කටයුතු කිරීමෙන් බෞද්ධ ශ්‍රාවකයාට තමන් දන්නා බව දන්නා පුද්ගලයෙක් බවට පත්විය හැක.

බුදු බණ ශ්‍රවණය කරන ශ්‍රාවකයා ඇසූ බණ ධාරණය කළ යුතුව ඇත. එසේ මතක තබාගත් බණ පදවලට අනුව ජීවිතය හැඩ ගසා ගත යුතුව ඇත. වැඩිය යුතු දේ වැඩිය යුතු ය. පුරුදු කළ යුතු දේ පුරුදු කළ යුතුව ඇත. ඒ සඳහා අප්‍රමාදීව කටයුතු කළ යුතුව ඇත. ඒ තුළින් බුදු දහමේ උතුම් අරමුණ කරා ළඟා විය හැක.



දෙහිඅත්තකණ්ඩිය
කපුවත්ත ආරණ්‍ය සේනාසනයේ
ශාස්ත්‍රවේදී
**බිබිලේ ධම්මසිරි හිමි**

මනසින් උසස් සත්වයා ලෙස සැලැකෙන මිනිසාට අනෙකුත් ජීවීන් අභිබවා ඉදිරියෙන් සිට ගැනීමේ හැකියාවක් ඇත. "මනුසත්වයා" කියැවෙන තැන "මනු" කොටස ගිලිහී ගිය තැන ඉතිරි වෙන්නේ "සත්වයා" කියන කොටස පමණි. එසේ වුවහොත් සත්වයාට හුරුපුරුදු ගති ලක්ෂණවලින් යුතු තිරස්චීන සතකුගේ ස්වභාව ලක්ෂණ මිනිසා තුළින් විද්‍යමාන විය හැක. එය වර්තමාන මානව ශිෂ්ටාචාරය තුළ සිදුවෙමින් පවතී.

පරිසරයට අනුව වුව ද වෙනස් වීමේ හැකියාව ඇත්තේ මිනිසාට ය. තම චිත්තවේග පාලනය කරගෙන ලබන අවබෝධය තුළින් ආත්ම දමනය කර ගැනීමේ අපූරු ශක්තියක් මිනිසාට ඇත.

එහෙත් එය වර්තමාන සමාජ තලය තුළ සිදු නොවීම ජාතියේ ම අභාග්‍යයකි.

විවිධත්වයට හේතුව තම තමන්ට සාපේක්ෂව ගොඩනඟා ගන්නා ලද ආකල්පයන් ය. තමන් හිතන්නේ, කරන්නේ, කියන්නේ කුමක්දැයි මනා සිහියක් තිබිය යුතු ය. ඉන් තමන්ට අයහපතක් හෝ අනුන්ට අයහපතක් හෝ දෙපාර්ශ්වයට ම අයහපතක් වේ ද යන්න තීරණය කරන්නේ මිනිසාගේ ප්‍රඥාවෙන් ය.

ප්‍රඥාව ගිලිහී ගිය තැන හැඟීම්වලට වහල් වී ගිය පහත් මනසක් නැඟී සිටී. ඒ බව නොදැක අන්ධානුකරණයෙන් ක්‍රියා කරන මිනිසාගෙන් තමාටත්, සමාජයටත් ඉටුවන්නේ අයහපතකි.

# රාගය

සමහරු ඇඟ සනීප ඇති ලස්සන බලු පැටියකු දැක ඌ වඩා ගනිති. ඌට කවති, පොවති. බොහෝ ආදරය දක්වති. එහෙත් ඒ අය ම මයිල් වැටුණු, ඇඟ පුරා කුෂ්ටයෙන් වැසුණු, වණ තුවාල සහිත, ඇඟෙන් දුගඳ හමන, කැහැටු බලු පැටියකු දැක, ඌ එළවා දමති. සමහර විට ගලින් මුලින් ගසා අහළකටවත් එන්නට නො දෙති. මෙසේ ඔවුන් එක බලු පැටියකුට ආදරයත්, තව එකකුට අනාදරයත් දක්වන්නේ මන්ද?

මෙහි රහස තවදුරට සිතා බැලුවා ම වැටැහෙයි. උන්ගෙන් ඔවුන් ආදරය දක්වන ඒ ලස්සන බලු පැටියා ම , ලොම් වැටී කුෂ්ට හැදී අවලස්සන වුවොත්, ඔවුන් එදා, ඌට සලකන්නේ උඩ දෙවැනි කී කැහැටු බලු පැටියාට සලකන අන්දමට ම හෝ එයට ටිකක් කිට්ටු තරමින් ය.

මෙසේ එකම සතාට අවස්ථා දෙකේ දී දෙ සැටියකින් ඔවුන් සලකති. මෙයින් හැඟෙනුයේ කිමෙක් ද? ඔවුහු ආදරය දක්වන්නේ ඒ බලු පැටියා ගේ ලස්සන ගතියට බව යි. එ බැවිනි ඌ ම අවලස්සන වූ විට ඔවුනට අප්‍රිය වෙන්නේ.

තිරිසනුන් ගැන පමණක් නොවැ, මිනිසුන් ගැනත් බොහෝ දෙනා ගේ ආදරය ඔවැනි යි. රූපය ලස්සන වැ ඇති කාලයෙහි ආදරය කරති. අවලස්සන වූ විට දකින්නටවත් කැමැති නො වෙති.

ඉතින් මෙසේ දක්වන මේ පෙරැළෙන 'ආදරය' හොඳ ගතියෙක් ද? කුසලයෙක් ද?"

මෙය හොඳ ගතියක් හැටියට, කුසලයක් හැටියට මෝඩයෝ හිතති. මෙහි සත්‍යය නම් මෙය කුසලයක් නොවේ, හොඳ ගතියක් ද නොවේ. මෙය නම් පිටට පෙනෙන රූපයට රැවැටී එයට සිතින් වාල් වීමෙකි. සිතින් එයට ඇදීයෑමෙකි. ඒ ගතිය කුසලයක් නොවේ. අකුසලයෙකි. සිතේ මහත්ම දුබල බවෙකි. රූපයේ ලස්සන ය පමණක් නොවැකට හඬේ මිහිරිකම ආදි තවත් දැය නිසා ද සමහරු අන් අයට ඇලුම් කරති. මෙයට, ප්‍රේමය, ස්නේහය, ආදරය කියා ඔහු නම් කරති. එහෙත් මෙය නම් රූප ශෝභාදිය නිසා සිතේ ඇති වන ලොල් බව යි. රාගය යි, තණ්හාව යි, ගුණදහමෙක් නොවේ අකුසලයකි.

**බළන්ගොඩ**
**ආනන්ද මෛත්‍රෙය මහ නාහිමි**
(බුද්ධ භක්තිය ග්‍රන්ථය ඇසුරෙනි)



# අපා දුක් ගිනි විඳින සත්වයන්

## එකම අපායක නැවත ඉපදෙන හැටි

මහා නිරයන්හි නැවත නැවත පහළවන සංජීවයයි. මෙම නිරය සියල්ලන්ට ම ඉහළින් පිහිටා ඇත. යමපල්ලන් විසින් දිලිසෙන නානා ප්‍රකාර ආයුධවලින් කඩ කඩා කොටමින් සිඳින ලද සත්ත්වයන් නැවත නැවත කර්ම බලයෙන් උපත ලබමින් ජීවත්වන බැවින් මෙම නිරය සංජීව නරකය යනුවෙන් හඳුන්වයි.

### ලුහුබඳිමින් පහරදෙන කාලසූත්‍රය

මෙහි උපන් යමපල්ලෝ නැවත නැවත නාද කරමින් පිළිවෙලින් දිලිසෙන නොයෙක් ආයුධ වර්ග රැගෙන දිලිසෙන ලෝහ පොළොවේ නිරිසතුන් ලුහු බැඳ පහර දෙති. දිලිසෙන පොළවේ වැටුණු කල්හි දිලිසෙන කළු නූලක් හෙළා දිලිසෙන පොරවක් ගෙන, උස් හඬින් නද දෙමින් විශාල බැගෑපත් හඬින් නාද කරන නිරිසතුන්ගේ ශරීර අට වැදෑරුම්, සොළොස් වැදෑරුම් කරමින් මෙහි පැසේ. එම අරුතින් කාලසුත්ත නම් වේ.

ප්‍රදුෂ්‍ය සිතින් මුනිවරයකු දෙස බලා ද, වයසින් වැඩිහිටියන්ට අවමන් කරයි ද මහර්ෂීන් නසයි ද ඔහු කාලසූත්‍රයෙහි පැසෙයි.

යසස, ධනය, නිසා පහළවන ලෝභය හා ද්වේෂය හේතුවෙන් පියා ඝාතනය කෙරේ ද මෙහි උපදී. නිරිසතුන් මෙහි බොහෝ කලක් දුක් විඳ ලෝකුඹු නිරයෙහි පැසේ.

### දිව්‍ය වර්ෂ ලක්ෂයක් පැසෙන තාපය

නිශ්චල වූ සත්වයන් තවන නිසා තාපන නම් වේ. මෙහි උපන් නිශ්චල සත්ත්වයෝ තල් ගසක් පමණ වූ දිලිසෙන යකඩ උලක් මත හොබවති. යට පොළව හා සත්වයන් දිලිසෙන අතර, මුල නො දිලිසෙයි ධර්මයෙහි නො පිහිටා, රට වනසන, ජනතාව පෙළන්නෝ දිව්‍ය වර්ෂ ලක්ෂයක් මෙම නිරයේ පැසේ. නිරි සතුන්ගේ සිරුරින් නිතර දිලිසෙන ගිනිසිලු නික්මෙන අතර, ලොම් මඟින් ද නිය වලින් ද, සිරුර දැඩි රශ්මියෙන් විනාශ වේ. ස්වාමියා හෙළාදකින, නැන්දම්මලාගේ වත් පිළිවෙත් ආදිය නොපුරන, ආහාර පානාදිය පිළියෙළ කිරීමේ වත් නොපුරන, හිරිඔතප් ධර්මයන්ගෙන් විරහිතව ක්‍රියා කරන ස්ත්‍රීහු මෙම නිරයේ උපදිති.

මොවුන් ස්වාමි ආදීන්ට අක්‍රෝෂ පරිභව කිරීමේ විපාක වශයෙන් මෙහි උපදින බැවින් යමපල්ලන්, නිරිසතුන් ලෝහ පඨවියේ හොවා යකඩ උලකින් මුව විවර කොට බලෙන් දිව අදිති. රැහැනක් බැඳීමෙන් බන්ධන සහිත ඇවිදිති. දිගු අඟ ආයුධවලින් සලකුණු කරන ලද තැන්වල මොහොතකින් එක් දඬු පමණ විශාල වූ ලෝහ තුඩින් යුක්ත පණුවන් ගැවසී ගනී. මොවුහු මෙම නිරයේ බොහෝ වර්ෂ සිය දහස් ගණනක් පැසවා නැවත මහා අපායේ පැසේ.

අධර්මයෙහි පිහිටා රට වනසන රජවරු, ජනපද පෙළන්නෝ මෙහි උපදිති. ගිනිසිලුවලින් වට කරන ලද දුකම අනුභව කරමින් දිව්‍ය අවුරුදු ලක්ෂයක් මෙහි පැසේ. ගිනි බත් අනුභව කරන ඔවුන්ගේ ශරීරයෙන් පැහැ විහිදෙන ගිනිසිළු නික්මෙති. ලෝම, නියපොතු ඇතුළු සියලු ශරීර අවයව ගිනිගෙන දිලිසෙති. නිරන්තරයෙන් ඇතුළත හා පිටත දැවෙන අකුසුවලින් ගසන ලද ඇතකු මෙන් නාද කරයි.

### අතිශයින් තවන ප්‍රතාපය

අතිශයින් තවන නිසා ප්‍රතාප නම් වේ. මෙහි උපන් සත්ත්වයෝ දිලිසෙන ආයුධවලින් පහර දී දිලිසෙන යකඩ පර්වතයට නංවාලයි. ඒ පර්වතය මුදුණේ සිටි කල්හි කර්ම විපාකයෙන් සුළං හමයි. ඔවුහු එහි සිටීමට නොහැකිව උඩුකුරු පා ඇතිව යටිකුරු හිස් ඇතිව වැටෙති. යට යකඩ පොළොවේ දිලිසෙන යකඩ හුල් නැඟී සිටිති. ඔවුහු ඒ මත්තෙහිම ඇනී ඔවුන් විනිවිද ගිය සිරුරු ඇතිව දිලිසෙමින් නිරතුරුව පැසවති.

### අයෝමය පර්වතයකින් තැලෙන සංඝාතය

මහත් වූ දිලිසෙන යකඩ පර්වතයෙන් මෙහි ඝාතනය කරනු යැයි සංඝාත නම් වේ. උපන් සත්ත්වයෝ නව යොදුන් පමණ ගිනිගෙන දිලිසෙන යකඩමය පොළවේ ඉඟටිය ප්‍රදේශය දක්වා ගිලී නිශ්චලව කල් ගෙවති. එකල්හි පෙර දිසාවෙන් ගිනිගෙන දිලිසෙන මහත් අයෝමය පර්වතයක් මතු වී හෙණ හඬ, නංවමින් ගර්ජනා කරමින් සත්ත්වයන් සියුම් කොට තලමින් බටහිර දෙසට යයි. බටහිර දෙසින් නැවතත් එබඳු පර්වතයක් පෙරදිගට ද, දකුණු දෙසට ද, උතුරු දෙසින් දකුණු දෙසට ද සත්වයා තලමින් යයි. දෙදිසාවෙන් පර්වත දෙකක් එකවර පෙරළීගෙන සත්ත්වයන් උක් දඬු සේ තලයි මිරිකයි.

අපිරිසුදු කාය වාග් මනෝ කර්ම ඇති, සංයමයෙන් තොරව ක්‍රියා කරන, අසංවරව හැසිරෙන, සැමියන්ගෙන් වෙන්ව අනාචාරයේ හැසිරෙන, වෙනත් රති ක්‍රීඩාවන්හි යෙදුණ ස්ත්‍රීහු මෙහි උපදිති.

### ගින්නෙහි දැවෙමින් හඬ තලන රෞරවය

ධූම රෞරවය හා ජාල රෞරවය යනුවෙන් රෞරව දෙකක් පිළිබඳ ජාතක අටුවාවේ සඳහන් වේ. එහි සත්වයෝ ගින්නෙහි දැවෙමින් යළි යළිත් හඬ තලති. එහෙයින් රෞරව යැයි කියනු ලැබේ. මෙහි තද ඝන අඳුරේ පවතින අතර දුම් දමයි. හුස්ම ගැනීමෙන් ඇස් දුබල බවට වී ඇස් අන්ධ වේ. ඒ තද අඳුර මීදුමෙන් පුළුල්ව පැතිර පවතී. අපුත්තක සිටුවරයා, වස්තුව නිසා තම සහෝදරයාගේ පුතා ඝාතනය කිරීමේ විපාකයෙන් නරකයෙහි ඉපිද සත් වැනි ආත්මභාවයේ දී ධනයට හිමි දරුවෙක් නොමැතිව සම්පත් රාජසන්තක විය. මොහුගේ පැරැණි පින් ද අවසන් වී අලුත් පින් රැස් නොකළ නිසා මිය ගොස් රෞරව නිරයෙහි ඉපදුණෝ ය. ජීවත්ව සිටි තාක් කල් දානාදී පින්කම් අතුරෙන් එකකුදු නොකළ ආගන්තුක සිටුවරයා මරණින් මතු රෞරව නරකයේ උපන් බව ජාතක අටුවාවේ සඳහන් වේ.

සෙට්ඨි ගෘහපතියා මහා රෞරව නිරයේ උපත ලද බව දීඝ නිකායේ අටුවාවේ සඳහන් වේ. මහානාරද කස්සප ජාතකයේ පරදාර සේවනයේ යෙදී ඉන් චුතව සිය පව්කම් හේතුවෙන් රෞරව නරකයෙහි බොහේ කලක් පැසුණු පුවතක් සඳහන් වෙයි.

> උපන් නිශ්චල සත්ත්වයෝ තල් ගසක් පමණ වූ දිලිසෙන යකඩ උලක් මත හොබවති. යට පොළව හා සත්වයන් දිලිසෙන අතර, මුල නො දිලිසෙයි. ධර්මයෙහි නො පිහිටා, රට වනසන, ජනතාව පෙළන්නෝ දිව්‍ය වර්ෂ ලක්ෂයක් මෙම නිරයේ පැසේ. නිරි සතුන්ගේ සිරුරින් නිතර දිලිසෙන ගිනිසිලු නික්මෙන අතර, සිරුර දැඩි රශ්මියෙන් විනාශ වේ.



මෙහි උපදිනවුන්ට තුනී කරන ලද ගිනිඅඟුරු ගොඩෙහි නිදා ගන්නට සිදු වන අතර වටේට දැවෙන ගින්නෙහි ඇතුළත් කරයි. යකඩ දැල්වලින් වෙළා මුව වැද්දෝ මුවන්ට හිංසා කරන්නාක් මෙන් මෙහි හිංසා විඳිති. පරදාර සේවනය කරන්නෝ, ආර්ය ධර්මයන්ට ගරහන්නෝ මෙහි උපදිති.

### පරණ පින් ගෙවී ගිය කල පහළවන මහා රෞරවය

ධන ලෝභයෙන් දිවි තොර කිරීම මෙහි ඉපදීමට හේතු වේ. පරණ පින් ගෙවී යාමත්, අලුතින් පින් නොකර ගැනීමත් මෙම නිරයේ ඉපදීමට හේතුවේ. එසේ උපන් සිටුවරයකු පිළිබඳ කතා පුවතක් දක්නට ලැබේ. ජාතක අටුවාවෙන් මෙම නිරය ගිලිහී ගොස් ඇති අතර, ඒ වෙනුවට මහා අවීචි යන්නත් විස්තර වේ.

තෙල්ලඹුර ශ්‍රී පුෂ්පාරාම විහාරාධිපති
උඩුමලගල ශ්‍රී ආදිච්චවංස පරිවේණාධිපති
යක්කලමුල්ල ශාසනාරක්ෂක බලමණ්ඩලයේ
ලේඛකාධිකාරී කීර්ති ශ්‍රී ශාස්ත්‍රපති
**පලල්ලේ සරණජෝති හිමි**

බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
දුරකථන - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

## මැදින් අව අටවක 2023-03-15

## මායාවක් නොවන සතුට ඇති තැන

මිනිසා සියල්ල කරන්නේ සතුටින් ජීවත් වන්නට ය. සුව පහසුව පිණිස ය. කෙනකුගෙන් කෙනකුට වෙනසකට ඇත්තේ සතුට උපයා ගන්නා විදිහේ ය.

මේ දේ හරි යැයි මුළා වූ කෙනෙක් වැරැදි මඟ යමින් සුවය සොයති. තවත් කෙනෙක් කවර හේතුවක් නිසා හෝ අඩුම තරමින් සිය මව්පිය දූ දරුවන් නිසා හෝ වරදක් කිරීමට නො පෙළඹෙති. ඔවුහු ජීවිතයේ සුව සොයනුයේ දැහැමිව ය.

මේ දෙපිරිස ම සමාජයේ ජීවත්වෙති. එහෙත් තමන්ටත් අනුන්ටත් අනර්ථයක් කර නොගෙන ධාර්මික සතුටක් විඳිනුයේ කවර හේතුවක් නිසා හෝ තමන්ගේ ධාර්මික ප්‍රතිපත්ති කඩ කර නොගන්නා පුද්ගලයා ය. එවැන්නෝ පවුලට, ගමට, රටට, ලෝකයට ද ගෙන දෙන්නේ සැනසුමකි. සැබෑ බෞද්ධයා එවැන්නෙකි. ඔහු කවර හේතුවක් නිසා හෝ පාපයට නැඹුරු නොවේ. පවෙහි ලජ්ජා බිය ඇත්තෙක් වේ.

**න අත්තහෙතු න පරස්ස හෙතු**
**න පුත්තමිච්ඡෙ න ධනං න රට්ඨං**
**න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධි මත්ත නො**
**ස සීලවා පඤ්ඤවා ධම්මිකො සියා**

ධම්ම පදයෙහි සඳහන් වන්නේ නුවණැති පුද්ගලයා තමන් නිසා පව් නො කරන්නේ ය. අනුන් නිසා පව් නො කරන්නේය. ඔහු සිය දියුණුව අදැහැමි බවින් කිසිවිටෙකත් නො පතන්නේ ය. නොකැමැති වන්නේ ය. ගිහියෙක් වුව ද පැවිද්දෙක් වුව ද ඒ තැනැත්තා සිල්වතෙකි. නුවණැත්තෙකි යනුවෙනි. මේ සැබෑ බෞද්ධයන්ගේ ස්වභාවය යි.

මෙම ගාථා ධර්මයට නිදානය වූ කතා පුවත දැන ගැන්ම ද බෞද්ධයාට ඉතා වැදගත් වන්නේ තම යහපත් අරමුණු මුදුන් පමුණුවා ගන්නට ඉවසීමෙන් බාධක ජය ගත යුතු ආකාරයත්, ආදර්ශ සම්පන්න ජීවිතය තුළ ඇසුරු කරන පිරිස් ද ජීවිතය අර්ථ සම්පන්න කරගන්නා ආකාරයත් අපූර්ව ලෙස විස්තර කෙරෙන බැවිනි.

සැවැත්නුවර ධම්මික නම් උපාසකයෙක් විය. දැහැමෙන් දිවි ගෙවූ ඔහු සිත බොහෝ කලක පටන් පැවිදිවීමේ බලවත් කැමැත්තක් ඇතිවුණි. ඒ බව සිය බිරිඳට දැන්වූ පසු ඇය කියා සිටියේ ඔහුට දාව ඇයගේ කුස දරුවකු පිළිසිඳගෙන ඇති බවත්, දරුවා බිහිවන තෙක් නො සිට මහණ වුවහොත් එය තමන්ට නිගාවක් වන බවත් ය. එහෙයින් දරුවා බිහිවුණු පසු මහණ වන ලෙස ඇය ඉල්ලා සිටියා ය.

උපාසක ද ඇයගේ කැමැත්තට ඉඩ දුන්නේ ය. දරුවා බිහිවීමෙන් පසු පැවිදි ජීවිතයට එළඹි උන්වහන්සේ භාවනාවට ම සිත යොමු කර වෙර වීර්ය වඩා රහත් ඵලය ලැබූහ. තම පියාණන් වූ ධම්මික තෙරුන්ගේ අනුශාසනා ලද පුතු ද පැවිදි විය. පිළිවෙත් පිරීමෙහි පසුබට නොවූ උන්වහන්සේ ද කලෙකින් රහත් බවට පත් වූහ.

සිය පුතු ද පැවිදි දිවියට ඇතුළත් වීම මවට දැරිය නොහැකි පාඩුවක් විය. එහෙත් තුනුරුවන කෙරෙහි ඇය ද බොහෝ සැදැහැ ඇත්තී ය.

“මම යම් කෙනෙක් නිසා ගිහිගෙයි විසුවෙම් ද මට සැනසුම ගෙන දුන් සැමියාත්, පුතාත් දෙදෙනා ම උතුම් සම්බුදු සසුනේ පැවිදි බව ලැබූහ. ගිහි ගෙදර දුක් කම්කටොලු මාගෙ හිස පිට පමණක් රැඳුණෝය"යි සිතා ජීවිතය කළකිරුණා ය. ගිහිගෙය හැරයම්'යි සිතා මෙහෙණවරට ගොස් පැවිදි වූවා ය. වීර්යවන්ත වූ ඇය විදසුන් වඩා කෙලෙස් සතුරන් බිඳ උතුම් රහත්ඵල ලැබුවා ය.

මෙසේ ධම්මික උපාසකගේ පවුලේ සියලු දෙනා උතුම් නිවනින් සැනසුණෝ පියෙක් ලෙස ධම්මික උපාසක තුළ වූ නොසැලෙන අධිෂ්ඨානය, ඉවසීම, වීර්යවන්ත බව හා ආදර්ශ සම්පන්න චරිතය නිසා ය. මෙවන් චරිත දැන කියවා ඒ ගුණදම් තමන් තුළ ද වඩා වර්ධනය කර ගන්නට බෞද්ධයා වෙර වීර්යය වඩන්නේ නම් සැබෑ සැනසුම ජීවිතයට දුර නොවනු ඇත.

# නිරවුල් මනසකට සමාදන් වූ සිල්පද නිතර සිහි කරන්න

**අප සතුන් මරන්නේ නැහැ කියන පන්සිල් පදය සමාදන් වෙනවා. එහෙත් අපි සතුන් මරන්නේ නැහැ කියල විතරයි දන්නේ. ඉන් එහාට දන්නේ නැහැ. සොරකම් කරන්නේ නැහැ කියලා සමාදන් වෙනවා. සොරකම් කරන්නේ නැහැ. ඒත් පුංචි පුංචි අවශ්‍යතා අනුව පුංචි පුංචි සොරකම් අපේ අතින් සිදුවෙනවා.**

ඒවා පිළිබඳ සැලකිල්ලක් නැහැ. උදාහරණයක් ලෙස කාර්යාලයෙන් දරුවාගේ අවශ්‍යතාවකට පොටෝ කොපියක් ලබා ගන්නවා. ඒ වගේ ම වැරැදිකාම ජීවිතය, බොරුව, කේළම, පරුෂ වචනය, හිස් වචනය පිළිබඳ අපේ ලොකු සැලකිල්ලක් නැහැ.

මත් වතුර, මත්ද්‍රව්‍යය භාවිතය කියන දේ අද අපේ රටට විතරක් නොවෙයි, මුළු ලෝකයට ම විශාල ප්‍රශ්නයක්. අපේ තරුණ දරුවෝ සියයට පනහකට වැඩි පිරිසක් මත්ද්‍රව්‍යයට හුරුවෙලා අවසානයි. මව්පියන් බොහෝ වෙලාවට උත්සාහ කරන්නේ දරුවන්ට ධර්මය දෙනවාට වැඩිය තාක්ෂණික දැනුම පමණක් දෙන්නයි. මුදල පසු පස පමණක් ගමන් කරන්නයි. අද අපි එහි විපාක අත්විඳිනවා.

මේ නිසා මනසේ පීඩාකාරී තත්වයෙන් මිදී නිරවුල් මනසක් ඇති කර ගන්න. අප සමාදන් වන පන්සිල් නිතර නිතර මෙනෙහි කරන්න. ඒ පිළිබඳ සතුටු වන්න. අනුස්සතියක් හැටියට වඩන්න. එය සීලානුස්සති භාවනාවයි.

මේ සීලානුස්සති භාවනාව කාර්යාලයට යන අතරතුර වුව ද වැඩිය හැකියි.

මා සමාදන් වූ පණ ඇති සතුන් මැරීමෙන් වැළකීම නම් වූ සිල් පදය පිරිසුදුයි. පිරිසුදුයි.

තවත් සමාදන් වූ සොරකම් කිරීමෙන් වැළැකීම නම් වූ සිල්පදය පිරිසුදුයි. පිරිසුදුයි.

වැරැදි කාම ජීවිතයෙන්, බොරු කීමෙන් වැළකීම කේළාම් කීමෙන්, පරුෂ වචන කීමෙන්, හිස් වචන භාවිතයෙන්, වැරැදි ජීවිකාවෙන් වැළැකීම නම් වූ ආජීව අෂ්ඨමක සීලය ම සිහි කරන්න.

ඔබ කාර්යාලයට යෑමට බස් රථයේ විනාඩි හතළිස්පහක් ගතවෙනවා නම්, ඉන් විනාඩි තිහක් අසුනක වාඩි වී මෙසේ මනසිකාරය කරන්න. එසේ මනසිකාරය කරමින් ගියා නම්, කාර්යාලය තුළට ඔබ ඇතුල් වන්නේ පීඩාකාරී මානසික තත්වයෙන් මිදුණු නිරවුල් මනසින් යුතු කෙනෙක් හැටියට යි.

අපි නොසිතුවාට, පුරුදු පුහුණු නොකළාට භාවනාවක් පුරුදු පුහුණු කර ගැනීමෙන් සමාජයට මෙන් ම ඔබට ද ධර්මානුකූලව කෙතරම් වූ ප්‍රතිලාභයක් ලැබෙනවා ද?

මේ ආකාරයෙන් ඔබගේ දිවා ආහාර වේලාවේ දී, එනම් පැයක කාලයෙන් පැය භාගයක් තුළ උදේ ම සමාදන් වූ සීලය මේ මොහොත වනතුරු එක සිල්පදයක් හෝ කඩා නැහැ. බොහෝ ම ගෞරවයෙන්



ශ්‍රී ජයවර්ධනපුර සිළුමිණි විහාරාධිපති
කම්මට්ඨානාචාර්ය
**මහමෙවුනාවේ මංගල හිමි**

යුක්තව ආරක්ෂා කළා යැයි සතුටු විය හැකියි. ඔබ කාර්යාලය නිමා කොට නිවස බලා යන කාලය තුළ ද, අද දවස තුළ කාර්යාලය තුළ සිල් පද ආරක්ෂා කළා. ඒ ගත් උත්සාහය පිළිබඳවත් සතුටු විය හැකියි. දවසේ වැඩ කටයුතු අවසන් කර නින්දට යන මොහොතෙත්, ඔබට කල්පනා කරන්න පුළුවන් අද දවස ගෙවුණා. මම උදේ සමාදන් වූ සිල්පද ආරක්ෂා කළා.

එක සිල් පදයක් හෝ පළුදුවෙලා නැහැ කියලා.

එවිට ඔබ සිල්වත් කෙනකු හැටියට නිදා ගන්නවා. ඔබ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෙක් ලෙස සුව සේ නිදන කෙනකු බවට පත්වෙනවා. සුව සේ අවදි වෙන කෙනෙක් බවට පත්වෙනවා. ඔබට දෙවියන්ගේ ආරක්ෂාව ලැබෙනවා. කරදරයක්, විපත්තියක්, අමනුෂ්‍ය දෝෂයක් ඇත්නම් තුනුරුවන්ගේ අනුහසින්, දෙවියන්ගේ උපකාරයෙන් ජීවිතයෙන් බැහැරට යනවා.

ඔබ පසුදා හිමිදිරි උදෑසන අවදිව කල්පනා කරන්න පැය විසි හතරක් පුරා මම මගේ සිල්පද ආරක්ෂා කළා. අද දවසෙත් මම සිල්පද ආරක්ෂා කරනවා. ඔබට දෙවැනි දවසටත් පියවර තබන්න පුළුවන්. සැබෑ බොදුනුවෙක්, තිසරණ සහිත බොදුනුවෙක්, සීලවන්ත කෙනෙක්, සීලයේ අනුසස් ලබන කෙනෙක් ලෙස ජීවත්විය හැකියි. එපමණක් නොවෙයි පීඩාකාරී මානුෂික බවෙන් නිදහස් ව නිරවුල් මනසකින් යුක්තව ජීවිතය පැවැත්වීමේ වටිනාකම අත්විඳින්න ලැබේවි. ගැටුම්කාරී පුද්ගලයෙක් නොවී සාමකාමී පුද්ගලයෙක් බවට පත්වේවි. මේ සමාජයේ යම් කිසි වටිනාකමක් ඇති පුද්ගලයෙක් වේවි. එසේ වටිනාකමක් ඇති අම්මා කෙනෙක්, තාත්තා කෙනෙක් වූවා නම් ඔබ ඔබේ දරුවාට කොතරම් වටිනවා ද?

ඒ වගේ ම ස්වාමි දියණියක් නම්, ඔබ ඔබේ ස්වාමියාට කෙතරම් වටිනවා ද?

ස්වාමියා එසේ වූවා නම් ස්වාමි දියණියට ඔබ කොපමණ වටිනවා ද?

ඔබේ ඥාති වර්ගයාට, අසල්වැසියාට ඔබ කොපමණ වටිනවා ද? මේ බව මෙනෙහි කරමින් සීලානුස්සති භාවනාව වඩන කෙනෙක් බවට පුරුදු - පුහුණු වෙන් න.

ඒ වගේ ම මෛත්‍රී සිත නැති වූ විට යම් කිසි කෙනෙක් සෑම විට ම ද්වේෂයෙන්, ව්‍යාපාදයෙන්, ක්‍රෝධයෙන් ඇළෙනවා. භාවනාවකින් සිත පුරුදු - පුහුණු කර නැති නිසා කොපමණ දන් දුන්නත්, කොපමණ මල්, පහන් පූජා කළත් ඔබ ක්ෂණිකව දැඩි ආවේගකාරී පුද්ගලයෙක් බවට පත්වෙනවා. ඒ සඳහා ද ඔබට පුළුවන් දවසේ පුංචි කාලයක්, එනම් විනාඩි පහක් හෝ දහයක් මම වෛර නැත්තෙක් වෙම්වා, නිදුක් වෙම්වා, සුවපත් වෙම්වා යැයි ඔබ ඔබට ම මෛත්‍රී සිත පතුරුවා ගන්න.

ඒ වගේ ම ඔබට පුළුවන් ඔබ මේ ලෝකයට බිහිකළ, හදා වඩා පෝෂණය කළ අම්මා ජීවතුන් අතර ඉන්නවා නම්, ඒ අම්මා මෙනෙහි කර මෛත්‍රී සිත වඩන්න.

ඒ වගේ ම ඔබේ පියා මෙනෙහි කර මෛත්‍රී සිත වඩන්න.

ඔබේ කල්‍යාණ මිත්‍රයා, කල්‍යාණ මිත්‍රයාණන් වහන්සේ නමක්, ආදී වශයෙන් සිතමින් මෛත්‍රී සිත පතුරුවන්නට පුළුවන්.

ඔබේ නිවසේ පිරිසට, කාර්යාලයේ අසල්වැසියන්ට ඔබ මෛත්‍රී පතුරුවන කෙනෙක් බවට පත්වන්න. ඒ ඇත්තන් මෙනෙහි කරන කෙනෙක් බවට පත්වන්න. මොනතරම් සාමකාමී මනසක් ඔබට හිමිවේ ද?

බුදුරජාණන් වහන්සේ සරණ ගිය, තෙරුවන් සරණ ගිය, පරිපූර්ණ සම්බුදු ශ්‍රාවකයෙක් බවට පත්වන්න ඔබට අවස්ථාව ලැබෙනවා. මේ නිසා මෛත්‍රී භාවනාව ඔබේ ජීවිතයට ඉතා ම වැදගත් භාවනාවක් හැටියට පුරුදු - පුහුණු කර ගැනීම ඉතා ම වටිනවා.

දීපා පෙරේරා

# උසස් මිනිසාගේ සිත සවිමත් නොවීමේ අරුමය



උදම්මිට උත්තමාරාම පුරාණ විහාරයේ
**උදම්මිට ධම්මානන්ද හිමි**

**කුඩා දියපහර මහා ගංගාවක් බවට පත්වෙයි. පුංචි වේයා මහා තුඹසක් බඳියි. විස්මිත මහා මන්දිරයක ආරම්භය මංගල පස් පිඬැල්ලයි. දුර ඈත වන්දනා ගමනේ සාර්ථක නිෂ්ටාව ගමනාරම්භය නිසාවෙනි.**

නොපසුබස්නා වීර්යයෙන් සිහිකල්පනාවෙන් ක්‍රියා කිරීමෙන් කෙනකුට මෙලොව දියුණුව සලසා ගැනීම උගහට නොවෙයි.

## පලිබෝධකයෝ

සුරාව, සූදුව, පව්ටු මිතුරු ඇසුර, අල්ලාප සල්ලාප, සම්පප්ප්‍රලාපය දියුණුවට පළිබෝධ ය.

මහ මඟ අගුපිළේ හුන් දුගියකුට ළඟින් ඇවිද ගිය රාජ පුරෝහිතතුමන්ගේ වදන තම දිවි මඟ සපුරා වෙනස් කොට දිළිඳු පැලේ සිටුමැඳුරක සිටු තනතුරකට මඟ පෑදුවේ ය. මී කුණකින් ඇරඹි දිවි ගමන සිටු මන්දිරයක සිටුවරයකු වන්නට දිළිඳු මිනිසාට උපකාරවත් වූයේ දෙදණින් වැටී නොඉඳ දෙපයින් නැඟිටීමේ ඕනෑකමයි. දණි පනි ගසා නැඟිටීමේ වුවමනාවයි. උට්ඨාන වීර්යයයි. මනා සිහිකල්පනාවයි. ධාර්මික හැසිරීමයි. නිවැරැදි ක්‍රියා පිළිවෙතයි.

අද බොහෝ ඇත්තෝ අප දිළිඳු යැයි තැවෙති. අපට අපේ මූලික වුවමනාවන් සපුරාගත නොහැකි යැයි වැළපෙති. දුශ්චරිතයෙන් බැහැරව බලවත් වීර්යයෙන් මනා සිහි ඇතිව, ජාති දූපුතුන් ගැන සිතා ධාර්මික දිවි පෙවෙතින් – අතමිට සරු හෙට දවස වෙනුවෙන් යමෙක් පේ වෙයි ද, ඇප කැපව ක්‍රියා කරයි ද, එවැනි තැනැත්තාගේ දිවි ගමන ඓශ්චර්යයෙන් බබළයි.

නැහැ බැහැ නොකියා හිරු නැඟුණු අරුණෝදයේ පටන් අඳුරු පැතිරෙන ගොම්මන දක්වා යමෙක් දහඩිය වගුරුවා වෙහෙස මහන්සියෙන් දියුණුව උදෙසා ව්‍යාවෘත වේ ද උත්සාහ සම්පන්න දියුණුවේ අභිලාෂ ඇති ශූර වීර ධීර මනු දිවිය එබඳු ධෛර්ය සම්පන්න තැනැත්තාට පමණක් නොව ඔහුගේ පවුලට දරු පැටවුන්ට, නෑසියන්ට, පය ගැසූ දේශයට අභිමානය යස ඉසුර කැඳවයි.

## පසුම්බියේ ඉතිරියයි කැදැල්ලේ සුවසෙතයි

සදාචාරය පසෙකලා සෞභාග්‍යය පැතීම වැලි මිරිකා තෙල් ප්‍රාර්ථනා කිරීමකි. උඳු වපුරා මුං බලාපොරොත්තු වීමකි.

දියුණුව, සංවර්ධනය යනු ආර්ථිකයේ දියුණුව පමණක් ම නොවෙයි. ආර්ථිකය හා බැඳි සියලු සමාජ සංස්කෘතික, අංශයන්හි වර්ධනය යි. දුරාචාරය , ආර්ථික දියුණුව ද සුනුවිසුණු කරයි.

දියුණුව පතන්නා පළමුව නිවස කළමනාකරණය කර ගත යුතු වෙයි. එක පවුලක දෛනික පරිභෝජනයට අවැසි මිරිස්, ඉඟුරු, රම්පෙ, කරපිංචා , කහ ගෙවත්තේ වැවෙත් නම් එබඳු පවුල් කිහිපයක මාසික අස්වැන්න කොතෙක් ද ?

මහ පොළොවේ සාරය, ගහකොළ ඇළ දොළේ ජීවය, හිරු සඳුගේ ශක්තිය කෙරෙහි විශ්වාසය නොතැබීම අමනෝඥකමකි.

තමාටත් අසන්නාටත් හිතදායක නොවන හිස් වදන් තෙපළන අමිල කාලය මෑ වැලකට, දඹල වැලකට, ගොටුකොළ, මුගුණු වැන්න පැළයකට මුසු කළහොත් පසුම්බියේ ඉතිරියට ද , දරු කැදැල්ලේ සුවසෙත ද ළඟාකර දෙනු නියත ය. බුදුන් වහන්සේගේ ඉගැන්වීම ධනය ඉපයීමට ය. හරිහම්බ කිරීමට ය. සම්මා ආජීවයට ය. නිවැරැදි දිවි පැවැත්මට ය. උත්සාහවත්ව ධනය ලබා, දරු පවුල් රැක ස්ව නෑසියනට හිතමිතුරනට සලකා යුතුකම් ඉටුකර කෙනකුට සැනසිය හැකි නම් හෙතෙම බුදුන් වහන්සේගේ මෙලොව දිවි සරසන පාඩම් උගත්තේ වෙයි.

කළමනාකරණය, ඉදිරි දැක්ම, පුරෝකථනය, සැලසුම්කිරීම අරපිරිමැස්ම යන සියලු නූතන ආර්ථික නිර්ණායකයන්හි සම්භවය බුදු දහම තුළ ය. බුදු දහමේ ආභාෂයෙන් එදා හෙළයෝ ලෞකික, පාර ලෞකික උභය විමුක්ති සාධනය ඉටු කර ගත්හ.

මෙලොව ආර්ථික සම්පත්තිය උදා කරගත්ත ද, ඉසුරුබර දිවියකට හිමිකම් කීව ද ධනය පරයන මනසකට උරුමකම් කීමට අපේ ඇත්තෝ භාග්‍යවන්ත වූහ. මෙබඳු ජනතාවක් විසූ, ලොවක් මවිත කළ ලක්මව ලොවට ම ආශ්චර්යයකි.

**වළවේ දෙනුන් හට කිරි හැම දිනම එරේ**
**වන්නියෙ බැඳෙන මී වද පැණි බිමට පෙරේ**
**මුතුපර තිබේ සමුදුර රැළි අතර තුරේ**
**පොළොවේ මැණික් උපදිනවා රත්නපුරේ**

***(පී.බී. අල්විස් පෙරේරා සූරීන් )***
***මගේ රට***

## සුසිරිත් බෝ වේවා

මැණික් උපදින දේශයක මිනිස්සු කාසිපනම් අගහිඟකමින් මිරිකී කඳුළු සලත් ද? ලොව එතරම් අභාග්‍යයක් තවත් වේ ද? ලොවට ම ඉසුර ගෙනෙන්නට නිසඟ වාසනා ගුණ ලත් මගෙ ලක් මෑණි දරු කැළ නැති බැරි, අගහිඟකමින් පෙළේ නම්, එය මවිතය දනවන්නකි.

විස්මිත රටක මිනිසුන්ගේ ඉරණම විස්මයට කරුණකි. දුසිරිත් බෝ වී සුසිරිත් වියැකීම රටේ පරාභවයට හේතුවයි.

අනලස් වේයා, මීමැස්සා, කුහුඹුවාගේ විපුලදායී ආදර්ශයෙන් මනසින් උසස් මිනිසාගේ සිත සවිමත් නොවන්නේ මන්දැයි ගැටලුවකි.

කඨොර අව්රශ්මි පීඩා ඉවසා, ගතේ මඩ තවරා, හදේ දුක් දරා අපට බත සපයන ගොවියාගේ සේවා ගැන ද සිතා මී මැසි පවුලක් සේ ලක්වැසි ජනතාව තම තම කාර්යභාරයට උර දේ නම්, රටේ සෞභාග්‍යය ඉන් උදා වේ.

බුදු දහමින් ඉගැන්වූ මහරු ඉගැන්වීම් සමුදායෙන් දොරින් දොර රන් උල්පත් පාදා දේශයේ සමෘද්ධිය උදාකර ගනිමු.

# තැනට සුදුසු නුවණ

නිපක යන ගුණය කෙනකුට ජන්මයෙන් ම උරුම වන්නක් නොවෙන්නට පුළුවනි. යම් පමණකට නුවණැතිව උපන් පුද්ගලයා එය වඩා වර්ධනය කර ගතයුතු ගතිගුණයක් කියලා කියන්නට පුළුවනි.

එය වැඩි දියුණු කර ගැනීමේ ක්‍රම කීපයක් තිබෙනවා. එහි දී කල්‍යාණ මිත්‍රයන්ගේ ඇසුර වඩාත් ම වැදගත් වෙනවා. එවැනි කල්‍යාණ මිත්‍රයන්ගේ ඇසුර නිසා එම කල්‍යාණ මිත්‍රයන් යම් යම් අභියෝගාත්මක කරුණු ඉදිරිපත් වුණාහම ඒවා මධ්‍යස්ථව භාර ගෙන ඊට අනුගමනය කරන ක්‍රියාමාර්ගයන් පිළිබඳ විමසිලිමත් වීම වැදගත් වෙනවා. එම අවස්ථාවන්හි දී එම අභියෝග ජයග්‍රහණය දක්වා බාධක කර නොගෙන විජයග්‍රණයන් හිමි කර ගැනීමට එම කලණ මිතුරන් අනුගමනය කරන ක්‍රියාමාර්ග පිළිබඳ විමසිලිමත් වී මනා සතියකින් යුක්තව පියවරෙන් පියවර එසේ ගත් පියවර සිහිතබා ගෙන ක්‍රියාකාරීවීම, වගේම එල්ලවන අභියෝග හමුවෙහි දී භාවිතයට ගන්නා ක්‍රියාමාර්ග සම්බන්ධව විමසිලිමත් වීම ද මෙහි දී වැදගත් වෙනවා.

එමෙන්ම යම් ගැටලු සහගත තත්වයක් ඇති වූ විට මේ ලෝකයේ ජීවත්වන ඇතැම් පුද්ගලයන් එවැනි ගැටලු තත්වයන්ට මුහුණ පා ක්‍රියා කළ ආකාරය අද අපට වහ වහා දැන ගැනීමේ සන්නිවේදන ජාලා පුළුල්ව තිබෙන නිසා ඒවා දැන ගෙන, ඒවා තමන්ගේ අත්දැකීම් බවට පත් කර ගෙන, ක්‍රියා කිරීමේ හැකියාව පවතින නිසා ද තැනට සුදුස නුවණ යොදා ගැනීමේ අවස්ථාව සැලසෙනවා. මෙහි දී පොතපත කියවා ලබා ගන්නා දැනුම මෙන්ම දෙස් විදෙස් සංචාර මගින් ඇති කර ගන්නා අත්දැකීම් ද මේ තැනට සුදුසු නුවණ මුවහත් කර ගැනීමේ ක්‍රියාවලියට මහත් ශක්තියක් බවට පත් වෙනවා.

ළමුන්ගේ අවශ්‍යතා විෂයයෙහි මව්පියන් ලවා වුව ද කැපසරුප් දේ ඉටු කරවා ගැනීමට දරුවන් ක්‍රියා කිරීමේ දී දරුවන්ගේ හික්මීම,

කීකරු බව සෙනෙහෙබර ස්වභාවය නිසා දරුවන්ගේ අවශ්‍යතා ඉටු කර දෙන්නට නිතරම දෙමාපියන් වුවත් නොයෙක් නැතිබැරිකම් තිබුණත් ක්‍රියා කරන්නේ ඒ දරුවන්’ හෝ ශිෂ්‍යයන් තැනට සුදුසු නුවණින් ක්‍රියා කළ තරමට යි යන්න මෙහි දී අප විසින් සිහිකටයුතු වෙනවා.

ශිෂ්‍යයන් හදන වඩන ගුරුවරුන් කෙරෙහි වුව ද මේ කරුණ මේ ආකාරයෙන් ම බලපාන බව පැවිදි පක්ෂයේ අය විසින් ද මැනවින් වටහා ගැනිම මේ අවස්ථාවේ දී වැදගත් වන බව ප්‍රකාශ කරන්නට හැකි යි.

මේ කරුණ තවදුරටත් ප්‍රකාශ කරනවා නම් ගෝලබාලයන් තමන්ගේ ගුරුවරුන්ගෙන් හෝ දරුවන් තමන්ගේ දෙමාපියන්ගෙන් හෝ යම් සාධනිය අවශ්‍යතාවත් ඉටු කරවා ගැනීමේ දී එම වැඩිහිටි ගුරුවරුන් මව්පියන් බොහොම සැනසිල්ලේ විවේකව සිටින අවස්ථාවල දී මෘදු මොළොක් ලෙස කරුණු ඉදිරිපත් කොට එම අවශ්‍යතා ඉටු කරවා ගන්නේත් මේ ශිෂ්‍යයන්ගේ හෝ දරුවන්ගේ තැනට සුදුස නුවණ මෙහෙයවා ක්‍රියා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් බව ද මෙහි දී සිහි කටයුතු වෙනවා.



මහනුවර අස්ගිරි මහා විහාරයේ
කාරක සංඝසභික හා උපාධ්‍යාය ධුරන්ධර
වයඹ පළාතේ ප්‍රධාන සංඝනායක මහාචාර්ය
**තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ නාහිමි**



# තමන් වෙනුවෙන් කාලය වෙන් කර ගන්න

**අපගේ බුදුරජාණන් වහන්සේගේ පිරිනිවනින් පසු මේ කතාව සිදුවෙලා තියෙන්නේ.**

එක්තරා කාලයක කුඩා දරුවෙන් පැවිද්ද ලැබුවා. ගුරු තෙරුන් වහන්සේ මේ කුමාරයාට පැවිදි නම ලබා දුන්නේ 'මහාසිව' කියලා. තුන්පිටකය ඉගෙන ගන්න මහ තෙරවරුන් සමීපයට යොමු කළා. දවසින් දවස, සතියෙන් සතිය, මාසයෙන් මාසය ගෙවී ගියා. මහාසිව සාමණේරයන් වහන්සේත් අධ්‍යයන කටයුතු හොඳින් කළා.

වසරින් වසර ගතවනවාත් සමඟ තුන් පිටකයේ ම හසල දැනුමක් ඇති තරුණ භික්ෂුවක් බවට පත් වුණා. ඉගැන්වූ ගුරු තෙරුන් වහන්සේ 'මහාසිව' තෙරුන්ට ආචාර්ය පදවියක් ද ලබා දුන්නා. වෙනදා පැමිණෙන ශිෂ්‍ය පිරිස ඉක්මවා ගිහින් ධර්ම විද්‍යාස්ථානය ශිෂ්‍යයන්ගෙන් පිරී ඉතිරී යන්න පටන් ගත්තා. අවුරුදු කිහිපයක් යන විට ශිෂ්‍ය පිරිස තිස් දහස ඉක්මවා ගියා. පැමිණෙන හැම ශිෂ්‍යයකු ගේ ම එකම බලාපොරොත්තුව 'මහාසිව' තෙරුන්ගෙන් තුන්පිටකය ඉගෙන ගැනීම යි. තවත් වසර කිහිපයක් ගත වන විට මහාසිව තෙරුන් වහන්සේගේ ශිෂ්‍ය පිරිසත් අධ්‍යයන කටයුතු අවසන් කර පිටත්ව ගියා. එහෙම ගිය එක් භික්ෂුවක් තමන් වහන්සේ ඉගෙන ගත් ධර්මය ප්‍රායෝගිකව ක්‍රියාවට නැඟුවා. රහත් භාවය ලබා ගත්තා. දවසක් තමන්ගේ ආචාර්යයන් වහන්සේ තුළ කවරාකාරයේ ගුණ පිහිටා තිබේ දැයි නුවණින් විමසා බැලුවා. එතැන දී දැක ගන්න ලැබුණා තවමත් රහත් භාවය ලබා ගෙන නැති බව. 'අපගේ ආචාර්යයන් වහන්සේ අනුන්ට උපකාර වෙනවා. නමුත් තමන් වහන්සේට උපකාර කරගෙන නෑ. මම උන්වහන්සේට උදව් කරන්න ඕන'යි කල්පනා කර දිනක් උදෑසනින්ම සිවුරු පොරවාගෙන අවශ්‍ය දේ රැගෙන ආකාශයෙන් වැඩම කර ආචාර්යයන් වහන්සේ ඉදිරියේ පෙනී සිටියා.

එවිට ආචාර්යයන් වහන්සේ හිඳගැනීමට අසුන් යොමු කර 'වැඩම කළේ මොනව හරි අවශ්‍යතාවකට ද?'යි විමසා සිටියා. ශිෂ්‍ය තෙරුන් වහන්සේ

'එසේය උපාධ්‍යයන් වහන්ස, මට එක්තරා උපදේශයක් ලබා ගන්න ඕන'යි පවසා සිටියා. ඒ අවස්ථාවේ

'මට ඔබගේ ගැටලු විසදන්න කාලයක් නෑ. උගත් ධර්මයෙන් ම පිළිතුරු සොයා ගන්න.'යි දන්වා සිටියා. ඒ අවස්ථාවේ දී ශිෂ්‍ය තෙරුන් වහන්සේ

'උපාධ්‍යයන් වහන්ස, එහෙම කරන්න එපා. මගේ ගැටලුව ඔබ වහන්සේට විවේකයක් ලැබෙන වේලාවට පහදා දෙන්න. එතෙක් බලාපොරොත්තුවෙන් වැඩ ඉන්නම්. ඔබ වහන්සේට පුංචිම හෝ විවේකයක් ලැබෙන වේලාවක් මට කියන්න. ඒ වේලාවෙ දි ගැටලුව විසඳා දෙන්න'යි ඉල්ලා සිටියා.

එයට පිළිතුරු විදිහට ලැබුණේ 'ඇවැත්නි, මට වෙන් කිරීමට වේලාවක් නෑ. එතරම්ම මම කාර්ය බහුලයි. ඔබ මෙතැනින් ඉවත්ව යන්න'යි දන්වා සිටියා. ආචාර්යන් වහන්සේගේ කතාව අහගෙන හිටිය ශිෂ්‍ය තෙරුන් වහන්සේ

'එසේ නම් පිණ්ඩපාතයේ වඩින වේලාවේ දී අහන්නම්'යි දන්වා සිටියා.

'පිණ්ඩපාතයේ වඩින විටත් වෙනත් අය කාලය වෙන් කර ගෙන සිටිනවා'යි උත්තර ලැබුණා. 'එහෙනම් සිවුරු පොරවන, දෙපට සිවුර නවන අවස්ථාවේ දී අහන්නම්'යි කියන විට

'ඇවැත්නි, මම ඒ අවස්ථාවත් දිගට ම වෙන් කරලා අවසන් මාස ගණනකට, වේලාවක් නෑ'යි කිව්වා. 'එහෙනම් ස්වාමිනි, පිණ්ඩපාතය වළඳන විට අහන්නම්'යි කියන විට එම වේලාවත් වෙන් කරලා අවසන් බොහෝ කාලයකට'.

මේ විදිහට බොහොම වෙහෙස ගෙන දෙන කාර්ය බහුල ජීවිතයක් තමයි මහාසිව තෙරුන් වහන්සේ ගත කළේ. තමන් ගැනවත් හිතුවේ නෑ. කීර්ති ප්‍රශංසාත්, භෞතික සැපසම්පත් ආදියත් බොහෝ සෙයින් ම ලැබෙන්න පටන් ගත්තා. තමන්ගේ කටයුතු තනිව ඉටුකර ගැනීමට නොහැකි නිසා ශිෂ්‍යයන් ඒවාට යොමු කර තිබුණා.

ශිෂ්‍ය තෙරුන් වහන්සේට ගැටලුව විසඳා ගැනීමට උපදේශයක් ගන්න වේලාවක් වෙන් කර ගන්න ම බැරිව ගියා. තමන් වහන්සේ අර්හත් භාවය ලබාගෙන සිටින බව මහාසිව තෙරුන් වහන්සේ දැනගෙන හිටියේ නෑ. විහාරයෙන් පිටත් වෙන්න සූදානම් වෙලා ගුරුවරයා අමතලා 'ස්වාමීනි, උපාධ්‍යායයන් වහන්ස, අමනාප වෙන්න එපා මෙහෙම කිව්වට. යම් මනුෂ්‍යයකුට තමන්ගේ මුහුණ කට සොදාගෙන මොහොතක් වත් ඉඳගෙන නිදහසේ කාලය ගත කරන්න වෙලාවක් තිබිය යුතුයි නේද? ඔබ වහන්සේ අනුන්ට උපකාර කරනවා තමයි. ඒ වුනත් තමන්ට උපකාර කර ගන්න වෙහෙසෙන්නේ නෑ. කාලය වෙන් කර ගන්නේ නෑ. බුදුරජාණන් වහන්සේ පැවිද්දාට අනුශාසනා කළේ කෙලෙස් නැති කර ගැනීම යි. මේ කරන සියලු ම වැඩ කෙලෙස් වැඩි කරනවා නේද? බුදුරජාණන් වහන්සේගේ ධර්මය මැනවින් දැනගෙනත් එයින් ප්‍රයෝජන ගන්නේ නෑ. ඔබ වහන්සේගේ උපදේශවලින් මට කම් නෑ'යි කියලා එතැනින් පිටත්ව ගියා.

'මේ ශිෂ්‍යයා ආවේ මාගේ ගුණ විමසා බලන්න. ඔව් මම රහත් භාවය ලබාගෙන නෑ තවම. අදම වන ගත වෙලා භාවනා කරනවා, විදර්ශනා වඩා රහත් භාවය ලබා ගෙන එනවා. දැන් බොහොම හවස් වෙලා, ඉතිරිවෙලා තියන වැඩ ටික ඉක්මනින් ම ඉවර කරලා පාන්දරින් ම මේ විහාරයෙන් පිටත් වෙලා වනයකට පිටත් වෙනවා'යි තීරණය කරගෙන මධ්‍යම යාමය වෙන විට යෙදී තිබුණු කටයුතු සියල්ල අවසන් කර තැබුවා. පාන්දරින්ම අවදි වී විහාරස්ථානයෙන් බොහෝ ඈත කඳු පර්වතයක ලෙනකට වැඩම කරලා භාවනා කරන්න පටන් ගත්තා. 'මම තුන් පිටකය ම හොඳට දන්න නිසා විදර්ශනා වඩන්න එතරම් වේලාවක් ගත වෙන්නේ නෑ. හෙට වෙනකොට රහත් භාවය ලබාගෙන යනවා'යි තීරණය කර භාවනා කරන්න පටන් ගත්තා.

ශිල්පය ඉගෙන ගත්තා සේ ඉතා පහසුවෙන් අර්හත් භාවය ලබා ගැනීමට කල්පනා කළා. එහෙත් රහත් වුණේ නෑ. සතියකින් රහත් වෙනවායි භාවනා කළා ඒත් රහත් භාවය ලබා ගන්න බැරි වුණා. තුන් මාසයක් ගත වුණා. ඒත් බැරිවුණා. අවසානයේ මෙහෙම තීරණය කර ගත්තා. රහත් භාවය ලබා ගෙන මිස මම ඇදේ නිදා ගන්නේ නෑ. පා දෝවනය කරන්නේ නෑ'යි තීරණය කරගෙන ඇද හකුළා දැම්මා. පා දෝවනය කරන භාජන ඉවත් කළා. අවුරුද්දක් ගත වුණා. ඒත් රහත් භාවය ලබා ගන්න බැරි වුණා. අවුරුදු දෙකක්, තුනක් ලෙසින් අවුරුදු විසි නවයක්ම ගත වුණා. ඒත් අර්හත් භාවය නම් ලබා ගන්න පුළුවන්කමක් ලැබුණේ නෑ. දැන් මහාසිව තෙරුන් වහන්සේට හරිම වේදනයි. වේදනාව ඉවසගන්න බැරිකමට ඇස්වල කඳුළු පිරුණා. කඳුළු ටිකෙන් ටික බිමට වැටෙන්න පටන් ගත්තා.

මේ දිහා බලාගෙන හිටියා අසල ගහක වැඩ සිටිය දේවතාවියක්. ඇයත් බොහෝම සද්දෙට අඬන්න පටන් ගත්තා. ටික වේලාවක් යන විට මහාසිව තෙරුන්ට ඒ හඬ ඇහිලා 'කවුද ඔය අඬන්නේ? මොකද කරදරයක් වෙලාවත් ද?'යි විමසා සිටියා.

එතකොට ඒ දේවතාවිය 'ස්වාමිනි මහාසිව තෙරුන් වහන්ස, මම දේවතාවියක් මේ ගහට අධිපති. හැඬීමෙන් මාර්ගඵල උපදවන්නට හැකි යැයි හිතලා මමත් අඬන්න පටන් ගත්තා'යි ප්‍රතිඋත්තර දුන්නා.

දැන් මහාසිව තෙරුන්ට බොහොම ලජ්ජයි. 'මේ දේවතාවියත් මට කවටකම් කරනවා, විහිළු කරනවා'යි හිතලා මුළු රාත්‍රිය පුරාම භාවනා කළා. පශ්චිම යාමයේ දී උතුම් අරහත් භාවය ලබා ගත්තා. හිතට බොහොම සොම්නසක් දැනුණා.

අවුරුදු තිහකට පස්සේ අද වැතිර නිදා ගනිමි'යි තීරණය කරලා ඇඳ සකස් කර තබා පා දෝවනය කිරීමට එළියට වැඩම කළා. උන්වහන්සේගේ අර්හත්භාවය අපේක්ෂා කළ ශිෂ්‍ය තෙරුන් වහන්සේ දිවැසින් දැක්කා තමන්ගේ ආචාර්යවරයා අර්හත්භාවය ලබා ගත් බව. 'ශිෂ්‍ය පිරිස තිස්දහසක් සිටිය දී උන්වහන්සේ පා දෝවනය කිරීමට යාම අප වැනි ශිෂ්‍යයන්ට සුදුසු නැතැ'යි තිස් දහසම එතැනට වැඩම කර පා දෝවනයට අවස්ථාව ඉල්ලා සිටියා.

'ඇවැත්නි, අවුරුදු තිහක් තිස්සේ මම පා සේදුවේ නෑ. ඔබ වහන්සේලා වෙහෙසෙන්න එපා. බොහෝ අපිරිසුදු පා දෙකක් මේ. පේනවා නේද ඔබ සියලු දෙනාට ම බොහෝ දුරක් ගෙවා පිණ්ඩපායේ වැඩම කළ නිසා පාද යටිපතුල් පැළී ගිහින්. ඒ නිසා මම ම සෝදාගන්නම්'යි කියා තමන් වහන්සේ ම පා දෝවනය කරන්න පටන් ගන්න කොට ශක්‍ර දෙවියන්ට මේ බව දැනුණා.

මහාසිව තෙරුන් වහන්සේ සමීපයට ළං වෙන්න අපහසු නිසා වහාම සුජාතා දෙවඟනත් සමඟ එතැනට වැඩම කළා. පසපස සිට 'ස්වාමිනි, ගැහැනියක්'යි කියමින් සුජාතාව පෙරටු කර ඉඩ ලබාගෙන උන්වහන්සේට සමීප වී මම ම පා දෝවනය කරම්'යි අවස්ථාව ඉල්ලා සිටි විට 'දෙව්රජුනි, අවුරුදු තිහක් මා පා සෝදා නෑ. අනික දෙවියන් මිනිස් ගඳ පිළිකුල් කරනවා. ඒ විතරක් නොවෙයි යොදුන් සියයක් ඈත සිටියත් ගෙල බැදි කුණක්වගේ මිනිස් ගඳ පිළිකුල් කරනවා. ඒ නිසා මම ම පා දෝවනය කර ගන්නම්'යි කී විට 'ස්වාමිනි, එහෙම කියන්න එපා. මිනිස් ගඳ පිළිකුල් වුණත් ඔබ වහන්සේගේ සිල් සුවඳ දිව්‍ය ලෝකයත් ඉක්මවා බ්‍රහ්ම ලෝක දක්වා පැතිර ගිහින්. ඒ නිසා මට අවස්ථාව දෙන්න'යි අවස්ථාව ඉල්ලාගෙන වමතින් ගොප් ඇට සන්ධිය අල්වාගෙන දකුණතින් පා තල හොඳින් පිරිමදිමින් සෝදා, නමස්කාර කර දෙව් ලොවට වැඩම කළා'යි කතා පුවතක් දීඝ නිකාය අටුවාවේ සක්කපඤ්ඤ සූත්‍ර දේශනාවේ සඳහන් වෙනවා.

කොතරම් උගත් වුවත්, මොන තරම් උසස් නිලතල දැරුවත්, කොපමණ කාර්යබහුල වුවත් තමන් වෙනුවෙන්, සසරින් මිදීම වෙනුවෙන් කාලය වෙන් කර ගැනීමට අමතක නොකළ යුතු බව මේ කතා පුවතින් පෙන්වා දෙනවා.

නූතන සමාජයේ කාර්ය බහුල ජීවිතයක් ගත කරන හැමදෙනාට ම ආදර්ශමත් කතා පුවතක්.



දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනවාසී
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**





# උතුම් දහම් ප්‍රතිපදාවට මේ සුදුසුම කාලයයි

**ලාංකීය අපට මෙන් ම ලෝකවාසී බෞද්ධයන්ට ඉතා වැදගත් දවසකි. එයට හේතු වනුයේ,**

බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම කිරීම, නන්ද කුමරුගේ පැවිදි බව ලැබීම, යශෝධරා දේවියගේ ගෞරවය ප්‍රකාශ කිරීම, රාහුල කුමරුන්ගේ පැවිදි බව ලැබීම, නිග්‍රෝධාරාමය පූජා කිරීම, ශාක්‍යයන්ගේ මානය දුරුකිරීම, ගෙපිළිවෙලින් පිඬු පිණිස වැඩීමේ අගය කියාදීම ආදි සුවිශේෂී සිදුවීම් ය.

ඒ අනුව හේමන්ත ඍතුවේ මැදින් පුර පසළොස්වක පොහෝ දිනය සම්බුද්ධ චරිතාපදානය පිළිබඳ අසිරිමත් සිද්ධි සමූහයක් සිහියට නංවන මංගල දිනයකි. ලෝකාර්ථ චර්යාවෙහි යෙදුණු බුදුරජාණන් වහන්සේ විසි දහසක් පමණ ආර්ය මහා සංඝ රත්නය පිරිවරාගෙන සුද්ධෝදන පිය මහ රජතුමාටත්, ස්වකීය ඥාතීන් වූ ශාක්‍ය වංශිකයන්ටත් යහපත උදාකරනු පිණිස රජගහනුවර වේළුවනාරාමයේ සිට කිඹුල්වත්පුර නුවරට වැඩමවීමට ගමනාරම්භ කළේ මැදින් පුන් පොහෝදාක ය.

බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වය අවබෝධ කොට රජගහනුවර වැඩ වසන බව ශාක්‍ය ජනපදයට ආරංචි විය. සුද්ධෝදන රජුට ස්වකීය පුත්‍රරත්නය දැකීමේ ආශාව බලවත් විය ය. අවස්ථා නවයක දී ප්‍රධාන ඇමතිවරු නව දෙනකු යටතේ නව දහසක් සේනාව බුදුරජාණන් වහන්සේ වැඩම කරවීමට රජගහනුවරට පිරිස යැවීය. ඔවුහු සියලු දෙන උතුම් බුදු සසුනේ පිහිට ලබා පැවිදි වී මහ රහතන් වහන්සේ බවට පත් විය. රජු කනස්සලෙන් පසු විය.

අවසානයේ දී බෝසතාණන් වහන්සේ සමඟ එකදා උපන් කාලුදායි ඇමති දහසක් සේනාව සමඟ පැවිදි වීමට රජුගෙන් අවසර ලබා ගෙන ම පිටත් විය. මේ වන විට ශාක්‍ය ජනපදයේ කුල කුමරුවන් දස දහස් දහයක් සම්බුදු සසුනේ පැවිද්ද ලබා මහරහතන් වහන්සේ බවට පත්වූහ.

කාලුදායි තෙරුන් පැවිද්ද ලබා සතියකට පසු පිය මහ රජුගේ ආරාධනාව සිදු කරමින් රජගහනුවර සිට කිඹුල්වතට ඇති මාර්ගයේ සුන්දර වර්ණනාවක් සිදුකළේ ය. එකී පරිසර වර්ණනාව හේමන්ත ඍතුවේ සුන්දරත්වය ප්‍රකාශ කිරීමකි.

භාග්‍යවතුන් වහන්ස, පරිසරය ඉතා ශීත වූයේ ද නැත. ඉතා උණුසුම් ද නැත. ඍතුව සුවදායක ය. ගමනට ඉතා සුදුසු ය. ආදී ගාථා හැටකින් ගමනට සුදුසු කාලය එළඹ ඇතැයි ආරාධනා කළහ. විසිදහසක් භික්ෂු සංඝරත්නය සමඟ රජගහනුවර වේළුවනාරාමයෙන් හවස් කාලයේ බුදුරජාණන් වහන්සේ ගමන පිටත් වූහ. පියමහ රජු ඇතුළු ඥාති සමූහයාට කළ යුතු උතුම්ම ඥාති සංග්‍රහයට මුල පිරූ මැදින් පුන් පොහෙඳය බෞද්ධයන්ගේ සදා ගෞරවයට පත් වූ දිනයක් විය.

සැට යොදුන් මඟ ගෙවා කිඹුල්වතට වැඩම කළ බුදුරදුන් ප්‍රධාන මහ සඟරුවනට ශාක්‍යයෝ පිළියෙළ කරන ලද නිග්‍රෝධාරාම විහාරය පිදූහ. මානයෙන් උදම් වූ ශාක්‍යයෝ ළදරුවන් ලවා බුදුරජාණන් වහ්නසේ වන්දනා කරවූයේ උන්වහන්සේ තමනට වඩා වයසින් බාල යැයි සිතා ය. ශාක්‍යයන්ගේ අදහස් දුටු උන්වහන්සේ යමාමහ පෙළහර පාමින් ශාක්‍යයන්ගේ මානය දුරු කළ අතර, එදින පිය මහ රජුගේ තුන්වැනි වැඳීම ද සිදු විය. එදින වෙස්සන්තර ජාතකය දේශනා කළහ.

පසුදා දහවල් දානයට කිසිවකුගෙන් ආරාධනා නොලැබූයෙන් බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නය කිඹුල්වත්පුර නුවර පුරා පිණ්ඩපාත දානයෙහි වැඩම කළහ. මෙය දුටු යශෝධරා දේවිය සුද්ධෝදන රජුට ඒ බව කීවා ය. ලජ්ජාවට පත් රජු කලබලයෙන් බුදුරදුන් හමුවී සිඟමන් යැදීම ශාක්‍ය වංසයට කළ නිගාවක් බව ප්‍රකාශ කළේ ය. මහ රජතුමනි, ඒ ඔබේ වංසයයි. මාගේ වංසය බුද්ධවංසයයි. මෙය අප වංසයේ ප්‍රධාන සිරිත යැයි රජතුමාට මහ මඟදීම පිණ්ඩපාතය වැඩම වීමේ අගය වටිනාකම කියා දී ධර්ම දේශනා කළහ.

**"ධම්මං චරේ සුචරිතං**
**නතං දුච්චරිතං චරේ**
**ධම්මචාරි සුඛං සේති**
**අස්මිං ලෝකේ පරම්හිඛ"**

රජගෙදර දී දානය වළඳා ඉහත ගාථාවෙන් රජගෙදර පිරිසට ධර්මය දේශනා කළ අතර, සුදොවුන් රජු සකෘදාගාමී මගඵල ලැබීය. ප්‍රජාපතී ගෝතමිය සුළු මව සෝවාන් තත්ත්වයට පත්විය. පියමහ රජු සමඟ යශෝධරාවගේ මාලිගයට බුදුරදුන් වැඩම කළ මොහොතේ ඇය සිරිපතුල සිපගෙන වැඳ වැටී අඬන්නට පටන් ගත්තා ය. මහා කරුණාවෙන් ඇයට සිත් සේ දුක දුරු කර ගන්නට ඉඩ ලබා දුන්හ. සුද්ධෝදන මහරජතුමා යශෝධරාවන්ගේ ගුණ ගයන්නට වූයේ ය. ඇයගේ ස්වාමි භක්තිය පතිවෘතා ගුණය විශිෂ්ට ලෙස වර්ණනා කළේ ය. සඳකිඳුරු ජාතකය වදාරා යශෝධරාවන්ගේ සසර ගුණ කියමින් බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කළ සේක.

බුදුරජාණන් වහන්සේ ජාත ග්‍රාමයට වැඩි තුන් වැනි දා නන්ද කුමරුන්ගේ රාජ්‍යාභිෂේක මංගල්‍යය, ගෘහ ප්‍රවේශ මංගල්‍යය, විවාහ මංගල්‍ය යැයි මංගලත්‍රයයක් විය. එදින රජමාළිගාවට වැඩම කළ බුදුරජාණන් වහන්සේ දන් වළඳා පිටත්ව යන ගමනේ දී නන්ද කුමරුට ස්වකීය පාත්‍රය දුන්හ. බුදුරදුන් පෙරටු කොට යන තම නන්ද කුමරු දුටු ජනපද කල්‍යාණී කුමරිය වහා එන්නැයි නන්ද කුමරුට ප්‍රකාශ කළා ය. එහෙත් සිදු වූයේ නොසිතුව දෙයකි. නන්ද කුමරුට පැවිදි වන්නට බුදුරජාණන් වහන්සේ කළ ඉල්ලීම බැහැර කළ නොහැකි විය. නන්ද කුමරු අකැමැත්තෙන් පැවිදි විය. පසු කලෙක දී සියලු කෙලෙස් නැසූ මහරහතන් වහන්සේ නමක් බවට පත් විය.

බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම වීමෙන් සත්වැනි දින විසිදහසක් මහා සංඝයා සමඟ මාළිගයට වැඩම කළහ. යශෝධරා දේවිය සත් හැවිරිදි රාහුල කුමරු සරසා නරසීහ ගාථා කියවා දායාද ධනය ඉල්ලා ගන්න යැයි පිතෘ ප්‍රේමය උපදවා බුදුරජාණන් වහන්සේ වෙත යැව්වා ය.

දන් වළඳා අවසානයේ මාළිගාවෙන් පිටත්ව යන බුදුරජාණන් වහන්සේ සමඟ පුංචි රාහුල කුමරු ද ආරාමයට ගියේ ය. තමා සතු ධනය රාහුල කුමරුට ලබා දීමට සැරියුත් මහ රහතන් වහන්සේ ආචාර්යවරයා ලෙසත්, මුගලන් මහරහතන් වහන්සේ උපාධ්‍යායන් වහන්සේ ලෙසත්, අවවාද ලබා දීම මහා කාශ්‍යප මහ රහතන් වහන්සේටත් පවරමින් සත් හැවිරිදි රාහුල කුමරු පැවිදි කළහ. බුදුරදුන් අත තිබූ සප්තාර්ය ධනය රාහුල හිමියන්ට ලබා දී කෙලෙස් නැසූ රහතන් වහන්සේ නමක් බවට පත් කළහ.

කුඩා රාහුල කුමරු පැවිදි කරවීම සුදොවුන් රජුට දරාගත නොහැකි දුකක් විය. බුදුරදුන් වෙත පැමිණි රජු "ස්වාමීනි, මවුපියන්ගෙන් අවසර නොලත් කුලදරුවන් පැවිදි නොකරන්නැයි ඉල්ලීමක් කළේ ය. බුදුරජාණන් වහන්සේ එය පිළිගත්හ. එදවස පටන් මහණෙනි, මව්පිය අවසරය නොලද කුල දරුවන් පැවිදි නොකළ යුතු යැයි අනුදැන වදාළහ.


පසුදා රාජමාළිගයට පිවිස දන් වැළඳූ බුදුරජාණන් වහන්සේට සුදොවුන් රජතුමා මෙසේ කීවේ ය. "ස්වාමීනි ඔබ වහන්සේ දුෂ්කර ක්‍රියා කරන කාලයෙහි දේවතාවකු අවුත් තොපගේ පුත්‍රයා මළේ යයි කී නමුත් මම එය නොපිළිගතිමි'යි කීය. එකල්හි බුදුරජාණන් වහන්සේ "මහරජ ඔබ දැන් පමණක් නොව පෙරත් එසේ නොපිළිගත්තේ යැයි" කියමින් මහා ධර්මපාල ජාතකය වදාළ සේක. රජතුමා එය අසා අනාගාමී ඵලයට පැමිණියේ ය. සුද්ධෝදන පිය මහ රජු රහත් බවට පත් කොට පිය මහ රජුට ධර්මයේ පිළිසරණ ලබා දුන්හ.

මේ අනුව බලන විට මැදින් පුර පසළොස්වක පොහෝය දිනය හා සම්බන්ධව සිදුවුණ ශාසනික කාරණා ඉතා වැදගත් වේ. ඔබ ද තම ජීවිතය ගැන තව තවත් සිතා සදාකාලික සැනසීම ඇති කර ගැනීමට අවශ්‍ය කරන ගුණ ධර්ම වර්ධනය කර ගැනීමට උත්සහ කළ යුතු ය.

**"උත්තිට්ඨේ නප්ප මජ්ජෙය්‍ය**
**ධම්මං සුචරිතං චරේ"**

යන බුදු වදනට අනුව නැඟී සිටි වීර්යය සහිතව ජීවත් වන්නට තම ජීවිතයේ එදිනෙදා කටයුතු කරනවා සේ ම, ජීවිතයේ පවතින නොසංසිඳෙන ආශාව, වෛරය, පළිගැනීම දුරු කර මානසික සහනය, විමුක්තිය ඇති කර ගැනීමට හේතුවන උතුම් දහම් ප්‍රතිපදාවේ නිරත විය යුතු ය. මේ ඒ සඳහා සුදුසුම කාලයයි.

**කලෙකිනි බුදු කෙනෙකුන් උපදින්නේ**
**දුකකිනි මිනිසත් බව ලැබ ගන්නේ**
**මෙදෙකිනි මෙසසර දුක් දුරලන්නේ**
**සුදනෙනි කිම වීරිය නොකරන්නේ**



දඩල්ල, වාලුකාරාම වෙහෙර වාසී
ශාස්ත්‍රපති
**රත්ගම සුනීත හිමි**

# එකිනෙකාට ගරු කරන හැටි ගෙදරින් කියා දෙන්න



සෑම නිවසකම අම්මා හිමවත් පව්ව වගේ යි. ඒ හිමවත් පව්ව වටේ සිටින දරුවෝ, සැමියා, මව්පියෝ, නෑදෑයෝ සියලුදෙනා ම ඒ ශක්තියෙන් තමයි යහපතට යොමු වන්නේ. අද බොහෝ නිවසේවල අම්මා පුරුදුවෙලා සිටිනවා දරුවන්ට නිවසේ බුදු පහන තියන්න කියන්න. බුදුරජාණන් වහන්සේට අම්මා පහන තිබ්බොත් ඒ පින අම්මාට යි. දරුවන් පහන තිබ්බොත් ඒ පින දරුවන්ට යි. අම්මා සවසට නිවසේ වැඩ අවසන් කොට මල් ටිකක් කඩාගෙන, පැන් එකක් පෙරාගෙන, පහනක් පත්තුකරලා පැය භාගයක් හෝ තෙරුවන් වන්දනා කරන්න පුරුදු වෙනවා නම් අම්මා පිටුපස යන දරුවන් එයට පුරුදු වෙනවා. ඒ සඳහා වෙලාව නැහැ කියන්න බැහැ.

අද බොහෝ අම්මලා රූපවාහිනිය ළඟ නැවතිලා. දරුවෝ පරිඝනකය ඉදිරියේ නැවතිලා. ඒ ඒ අය ඒ ඒ ලෝකවල හිර වෙලා. ඒ වෙලාව අරගෙන මගේ දරුවන්ටත් යහපතක් වෙන්න මම හරියට මේ දේ කරන්න ඕන කියා සිතා සිතට හයිය අරගෙන විකාර දර්ශන බලන එක නවත්වලා තෙරුවන් ගුණ සිහි කරලා පිරිත් ටිකක් කියලා දිනපතා බුද්ධ වන්දනාව කරන්න පුරුදු වුණා නම් ඒ නිවස කෙ තරම් සාමකාමී ද? රූපවාහිනියේ නාට්‍ය බැලීම ඔබ පුරුද්දක් කරගෙන සිටිනවා නම් එයින් අත මිදෙන්න. මේ රූපවාහිනිය මගේ කාලය කො තරම් ගන්නවාද කියා සිහි කරන්න. ළමයින්ගේ කටයුතු අඩාල වෙලා නේද කියා සිහි කරන්න. නිදිමත එනතුරු රූපවාහිනිය නරඹලා නිදිමත ආ විට ගොස් නිදා ගන්නවා. එය මඟහැර ගැනීමට ඇයට දක්ෂතාවයක් මෙන්ම ප්‍රඥාවත් අවශය ම යි. එය නිස්සාර දෙයක් කියා සිහි කරන්න. නාට්‍ය කියන්නේ කාගේ හෝ සිතක උපන් සිතිවිල්ලක් පමණ යි. අපි ඒ දෙස බලාගෙන එතැන රණ්ඩු වෙනකොට අපිත් රණ්ඩු වෙනවා. ඒ අය අඬද්දි අපිත් අඬනවා. ඒ අය සිනා වෙද්දී අපිත් සිනහා වෙනවා. නළු නිළියෝ මුදල් උපායගෙන යනවා. අපි අපේ කාලය වනසා ගන්නවා. ඊට පස්සේ හෙට වෙනතුරු කල්පනා කරන්නේ මොකක් වෙයිද දන්නේ නැහැ. හෙට කොටසේ මෙහෙම තිබුණොත් හොඳයි කියලා චිත්තරූප මවාගෙන කල්පනා කරමින් තමන් ගේ කාලය අපතේ අරිනවා. සිතින් තර්ක විතර්ක කරමින් සිටිනවා. තමන්ගේ ප්‍රශ්න මදිවට අනුන්ගේ ප්‍රශ්නත් තමන්ගේ කර ගන්නවා.

එසේ නො කොට එහි ඇති නිස්සාර බව දකින්න. සිත ඒවාට යට වෙන්න නො දී සරු දේ නිසරු දේ හඳුනා ගන්න. බොහෝ දෙනාට නිසරු දේ සරු දේ ලෙස පෙනෙනවා. නිසරු දෙයට ආශා කරනවා. එහෙම වුණොත් තමන් නිකම්ම ප්‍රමාදයට පත් වෙනවා. සරු දේ නිසරු දේ හඳුනාගෙන නිසරු දේ බැහැර කරන්නට හිතට හයිය තිබෙනවා නම්, නුවණින් කල්පනා කරන්න. ප්‍රඥාව තිබෙනවා නම්, නිසරු දෙයින් ඈත් වෙන්න ශක්තිය තිබෙනවා නම් ඇයට ධර්මයේ හැසිරෙන්න හොඳ විවේකයක් ලැබෙනවා.

එනිසා අම්මා තාත්තාට ගරු කරනවා නම්, දරුවෝ තාත්තාට එකට එක කියන්නේ නැහැ. අම්මා තාත්තාගේ වැරැදි ප්‍රසිද්ධියේ කියා කෑ ගසන්නේ නැත්නම් දරුවෝ තාත්තාට ඇඟිල්ල දිගු කරන්නේ නැහැ. දරුවෝ තාත්තාට අම්මාට කෑ ගසන්නේ ළමයි ඉදිරියේ අම්මා තාත්තා එකිනෙකාට චෝදනා කරන නිසයි. මවුපියන් අතරේ යම් අමනාපයක් ඇතිවුණොත් එය දරුවන්ට නෑසෙන අයුරින් බේරා ගැනීමට මවුපියන් දක්ෂ විය යුතුයි. ළමයෙක් තාත්තාට මොනවා හරි කිවුවොත් පුතේ ඒ ඔයාගේ තාත්තා. එහෙම කියන්න එපා කියලා අවවාද කරන්න පුළුවන්නම්, දරුවෝ අම්මාට සැර වෙද්දී එහෙම කතාකරන්න එපා මේ ඔයාගේ අම්මානේ කියලා තාත්තාට කියන්න පුළුවන් නම් එතැන ගොඩනැගෙන්නේ සමඟියක්.

## සැබෑ ධනවතකු වීමේ හැකියාව තිබෙන්නේ තමන් තුළ ම ය

දිනක් මහා ශ්‍රාවක සංඝරත්නය අරභයා භාග්‍යවතුන් වහන්සේ වදාළා “පින්වත් මහණෙනි, යම් කෙනකුට ශ්‍රද්ධාවක් නැති නම් පවට, විපාකයට බයක් නැත්නම්, පව්වලින් මිදෙන්න වීර්යය නැත්නම්, කුසල් අකුසල් තෝරා බේරාගෙන කටයුතු කරන්න ප්‍රඥාවක් නැත්නම් ඔහු හෝ ඇය මේ ශාසනයේ අන්ත දුගී දුප්පතෙක්.

සාමාන්‍ය ලෝකයේ දී ඒ පුද්ගලයාට මුදල් භවභෝග සැප සම්පත් යහමින් තිබෙන්නට පුළුවන්. ඒත් ඔහු තුළ ශ්‍රද්ධා, හිරි, ඔත්තප්ප, වීර්යය, ප්‍රඥා කියන ගුණධර්ම නැත්නම් මේ ආර්ය විනය තුළ, බුද්ධ ශාසනය තුළ ඔහුට කියන්නේ දිළින්දා කියලයි. දුප්පතා කියලයි. එහෙම නම් ශ්‍රද්ධාව කියන්නේ ධනයක්. පවට බය කියන්නේ ධනයක්. පව් දුරුකර ගැනීමට වීර්යය ගැනීම ධනයක්. පවට බය කියන්නේ ධනයක්. නුවණ, ප්‍රඥාව කියන්නේ ධනයක්.

පින්වත් මහණෙනි, ඒ පුද්ගලයාට ශ්‍රද්ධාවක් නැති නිසා කාය දුෂ්චරිතයේ යෙදෙනවා. වචී දුෂ්චරිතයේ යෙදෙනවා. මනෝ දුෂ්චරිතයේ යෙදෙනවා. තථාගතයන් වහන්සේගේ අවබෝධය ගැන පැහැදීමක් නැහැ. විශ්වාසයක් නැහැ. මෙලොව පරලොව ගැන, පින් පව් ගැන, සසර ගමන ගැන, සතර අපාය ගැන ධර්මය තුළින් උපදවා ගත් දැනුමක් අවබෝධයක් නෑ. ඒ නිසා කිසිම බයක් චකිතයක් නැතිව පව් කරනවා. අවස්ථාව ලද තැන සතුන් මරනවා. සොරකම් කරනවා. අල්ලස් ගන්නවා. වංචා දූෂණ කරනවා. වැරැදි කාමසේවනයේ යෙදෙනවා. ඒ වගේම වචනයෙන් බොරු කියලා ලෝකයා රවටනවා. කේළාම් කියලා සමඟිය බිඳවනවා. අභූතයෙන් චෝදනා කරනවා. අන් අයගේ හිත රිදෙන කටුක පරුෂ වචන කියනවා. වචනයෙන් බැණ වදිනවා. නින්දා අපහාස කරනවා. මෙලොවට පරලොවට වැඩ නැති හිස් වචන කියනවා. ඒ වගේම රාග, ද්වේෂ, මෝහ ආදී අකුසල් සිතිවිලි හටගනිද්දී ලජ්ජා බයක් නැහැ. නුවණින් කල්පනා කරන්න වීර්යයක් නැහැ. සිතිවිලිවල සමවැදී මනෝ ලෝකවල ජීවත් වෙනවා. මිථ්‍යා ආකල්පවල ගැලි ගැලී සිටිමින්, වරදේ බැඳෙමින්, සිතින්, කයින්, වචනයෙන් කටයුතු කරනවා.

පින්වත් මහණෙනි එසේ කටයුතු කරන තැනැත්තාට මේ බුදු සසුන තුළ ආර්ය විනය තුළ කියන්නේ ණය ගන්නවා කියලා. මෙසේ ගන්නා ණය කවදා හෝ ගෙවන්නට සිදු වෙනවාමයි.

ඊළඟට ණයත් සමඟම පස්සෙන් එන දේ පොළිය. අපගේ බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළා. මේ පුද්ගලයා වැරැදි කරනවා. නමුත් ඔහු සිතනවා. “මම කරන මේ වැරැදි කවුරුවත් දන්නේ නැත්නම් හොඳයි. දකින්නේ නැත්නම් හොඳයි කියලා ලෝකයාට හොර රහසේ ම වැරැදි කරනවා. පිටට පෙනෙන්නේ . “හොඳ පුද්ගලයෙක්” ලෙසටයි. පිරිස අතරේ බොහෝ ම වැදගත් ගුණ ගරුක කෙනෙක් ලෙස රඟපානවා. නමුත් සැබෑ ජීවිතයේ දී සිතින්, කයින්, වචනයෙන් වරදේ බැඳෙනවා. ඔහු දන්නේ නෑ ඒ එකතු වෙන්නේ පොළිය කියලා. ණය විතරක් නොවේ ගෙවනකොට පොළියත් එක්කමයි ගෙවන්න වෙන්නෙ.

අපි දන්නේ ම නැතිව ණයත් පොළියත් එකතු වේවි. යම් දවසක සීමාව ඉක්මවා යනවා. එවිට බොහෝ සේ චෝදනා එල්ල වෙනවා. එවිට තමාගේ සිත තමාට ම චෝදනා කරන්න පටන් ගන්නනවා. ලෝකයාට වැරැදි හැංගුවාට හෘද සාක්ෂිය චෝදනා කරන්න පටන් ගන්නවා. නුඹ මෙහෙම කළා, නුඹ මෙහෙම කෙනෙක් ආදී ලෙස සිතමින් බලවත් අසහනයෙන් පෙළෙනවා. හිතේ පීඩාවක් තැවුලක් ඇතිවෙනවා. එවිට තනිව විඳවන්න වෙනවා. හෘද සාක්ෂිය තමන් ලුහුබැඳ එනවා. යන්න දිශාවක් නැහැ. ඒ අතරට තමන්ට අමතක වූ ණයත් මතක් වෙනවා. එනිසා භාග්‍යවතුන් වහන්සේ වදාළ පරිදි අපිත් ණය නොවන චරිතයකට හුරු වෙමු. ණය වූ විට පොලියත් ගෙවන්නට වෙනවාමයි. එනිසා ආර්ය විනය තුළ හික්මෙන්නට අපි උත්සාහ කරමු.



නයනා නිල්මිණී



# චේතනාව ම කර්මය වේ

**මේ ලෝකයේ සදතනික සුවපත් බවක් ලැබූ යම් කෙනෙක් වෙත් නම් ඒ බුදු, පසේබුදු ,මහරහත් උතුමෝ ය. සසර නම් වූ මහා බිහිසුණු සාගරය තරණය කිරීමට සමත් වන්නේ ධර්මය නම් වූ නෞකාවෙන් පමණි. ධර්මය අනුව ක්‍රියාත්මක වන්නා සුගතියට පත්වීම දක්වාම සුරක්ෂිත වන්නේ ය.**

බුදුරජාණන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයේ මෙකල වැඩ සිටියහ. ඒ කාලයේ රජගහනුවර සිටු පවුලක දියණියක් බොහෝ රූපශ්‍රීයෙන් යුක්ත වූවා ය. තුරුණු වියෙහි පසු වූ, ඇය කම් සැපයෙහි ද ලොල් විය. මව්පියන් ඇය ඉතා හොඳින් ආරක්ෂා කිරීමේ අරමුණින් සිටු මැදුරෙහි උඩුමහල ඇයට ම වෙන්කර, එහි ඇයට අවශ්‍ය සියලු දේවල් සහිතව රඳවා තැබීය. මේ කාලයෙහි කුක්කුට මිත්ත නම් වූ වැදි පුරුෂයෙක් මුවන් මරා ඒ මස් කරත්තයක පටවාගෙන නගරයට විකිණීම සඳහා ගෙන යන ගමනේ සිටු මැදුර අබියස මාර්ගයේ ගමන් කළේ ය.

සිටු දියණියට උඩු මහලේ සිට මාර්ගය හොඳින් පෙනේ. මග දිගේ යන වැදි පුරුෂ යා ඇගේ නෙතට හසු විය. ඒ පුරුෂයා කෙරෙහි තදබල ඇල්මක් ඇයට ඇති විය. මෙබඳු බැඳීමකට හේතු වූයේ ඒ පුද්ගලයා පෙර අත්බවෙහි ඇයගේ ස්වාමියාව සිටි බැවිනි. ඔහු කෙරේ බැඳී ගිය සිත කෙසේවත් වෙනස් කළ නොහැකි වූ තැන ඇය තම ආරක්ෂාවට සිටි සේවිකාව ද තම අදහසට නංවාගෙන තමා ඇඳ පැළඳ සිටි වටිනා ආබරණ හා සළු, පිළි උනා තබා පරණ වී ගිය වස්ත්‍රවලින් සැරසී මඟට බැස පයින්ම ගමන් කර එක්තරා ස්ථානයකට වී, වැදි පුරුෂයා ආපසු පැමිණෙන තෙක් බලා සිටියා ය. කුක්කුට මිත්ත ආපසු එනු දැක ගැල තමා පසුකර යත්ම ගැල පසුපසින් ඔහුට නොදැනෙන සේ ගමන් කළා ය. වැදිතෙම තම ගැල පසුපසින් තමා අත නොහැර එන මේ රූමත් ලලනාව ගැන විමසිලිමත්ව ගැල නවතා ඇය කවුද? කවර කාරණයක් උදෙසා ගැල පසුපසින් එන්නේ දැයි විමසීය. ඇය තමාගේ අදහස පවසා මොන තරම් දුක් විඳීමට සිදු වුවත් ඔහු සමඟ වාසය කිරීමට එන බව කීය. වැදිතෙම ඇගේ ඒම නවතාලීමට කොතෙකුත් උත්සාහ කළත් එය කළ නොහැකි විය. අවසානයේ ඇගේ මහත් ඉල්ලීම නිසා ඔහු ඇය ගැලෙහිම හිඳුවාගෙන පිටිසර කැලෑබද තිබූ තම නිවසට කැඳවාගෙන ගියේ ය.

මෙසේ වැදි පුරුෂයා සමඟ ප්‍රේමයෙන් වාසය කළ ඇය ඔහුගේ සුවච කීකරු භාර්යාව වූවා ය. මේ දෙදෙනාට දාව පුත්තු සත් දෙනෙක් උපන්හ. ඔවුන් නිසි වයසට පත් වූ පසු භාර්යාවන් ද සරණ පාවා දුන් අතර, මොවුහු සියලු දෙනා එකම නිවසේ විසූහ දඩයම ඔවුන්ගේ ජීවනෝපාය විය.

එකල්හි ලොව බලා වදාරණ බුදුරජාණන්වහන්සේට කුක්කුට මිත්ත ප්‍රධාන එම දරු පවුල දර්ශනය විය. ඔවුන් සියලු දෙනා සෝවාන් ඵලයෙහි පිහිටන බව බුදුරජාණන් වහන්සේ දුටුවහ. වැදි තෙම කැලයේ කිහිප තැනකම මළ පුඩු, අටවා තැබීම සිරිතක් කරගෙන සිටියේය. බුදු පියාණන් මේ බව දැන ඒ මළ පුඩු කිසිවකට සතුන් හසු නොවේවායි අදිටන් කර අවසාන මළ පුඩුව තිබෙන ස්ථානයට නුදුරෙහි ගසක් මුල වැඩ සිටියේ තම සිරිපා සටහන් ද වැදි පුරුෂයාට දැක ගත හැකි ලෙස තබමිනි.

වැදි තෙම මළ පුඩු එකිනෙක පිරික්සා බලමින් කිසිම සතකු හසු නොවන, බව දැක අවසාන මල පුඩුව දෙසට යන විට පා සටහන් ද දුටුවේය. මගේ සතුන් මුදාහැරියේ මේ පා සටහන් අයත් පුද්ගලයා විය යුතු ම යි සිතා පා සටහන් අනුව ගොස් බලන විට රුකක් මුල වැඩ හුන් බුදුපියාණන් දුටුවේ, ඉමහත් කෝපයෙන් යුතුව හීය දුන්නට තබා මානාගෙන මුදාහැරීමට දුනු යොත අදින්නට සැරසුණේ ය.

බුදුරජාණන් වහන්සේ ඒ මොහොතේ දී ම මොහුට දුන්න ඇදගත නොහැකි වේවායි ප්‍රාර්ථනා කළ සේක. වැදි පුරුෂයා දුන්න දික් කරගත් වනම ගල් ගැසුණි. ඔහුට දැඩි පීඩාවක් ද ඇඟ පතේ ප්‍රාණය නිරුද්ධ වූවා සේ ද දැනුණි.

වැදි ගෙදර ඇත්තෝ ඉමහත් කලබලයට පත්වූහ. වෙනදා මළ පුඩු විමසා බලා ඒවාට හසුවී සිටින සතුන් වේ නම් ඒ සතුන් රැගෙන වේලාසනින් ගෙදර එන පියාණන් අද මෙතරම් ප්‍රමාද වන්නේ කිසියම් අනතුරක් වත් වුණි දැයි සිතා පුත්තු සත් දෙනාම පියාණන් සොයා පිටත්වූහ.

බුදුරජාණන් වහන්සේ දෙසට දුන්න මානා ගෙන විදගත නොහැකිව ගල්ගැසී සිටින පියාණන් ඔවුන්ට දැක ගත හැකි විය. මොවුන් ද පියා අනුගමනය කරමින් දුනු මානාගෙන විදින්නට උත්සාහ ගත් මුත් ඔවුන්ට සිද්ධ වූයේ ද පියාණන්ට සිදු වූ දේ ම ය. පුතුන්ගේ ප්‍රමාදය නොඉවසූ බිරින්දෑවරු සත් දෙන ද මාතාව ද මොවුන් සොයා එදෙසට පිටත්වූහ. දුනු මානාගෙන ගල්ගැසී සිටි අට දෙනා ඔවුන්ට දක්නට ලැබුණු අතර ඒ ඊ එල්ල වී ඇත්තේ කා දෙසට දැයි බලත් ම ඉලක්කය බුදුරජාණන් වහන්සේ බව මව සැණෙකින් හැඳින්නා ය. ඇය වහා බුදුරජාණන් වහන්සේ දෙස හැරී, දෙඅත් හිසෙහි තබා ගෙන "මගේ පියාණන්ට විදින්නට එපා"යයි මහ හඬින් කෑ ගසමින් එදෙසට දිව ගියා ය. පියාණන් යැයි ඇමතූ ආකාරයෙන් කුක්කුට මිත්ත සිතුවේ ගස මුල සිටින්නේ තම භාර්යාවගේ පියාණන් බවයි. දුනු ඊතල ඉවතලා බුදුපියාණන් ක්ෂමා කර ගන්නා හැටියට මෑණියන් තම පුතුන්ටත් ස්වාමි පුරුෂයාටත් කීවා ය. එවිට සියල්ලෝ ම බුදුරජාණන් වහන්සේට වැඳ සමාව ගත්හ.

බුදුරජාණන් වහන්සේ මේ පිරිසට චතුරාර්ය සත්‍ය ධර්මය දේශනා කරමින් රූප, වේදනාදි ස්කන්ධ පඤ්චකය, අනිත්‍ය,දුක්ඛ, අනාත්ම වශයෙන් දකින ලෙසත්, මම, මගේ, මගේ ආත්මය යන මුළාවෙන් මිදී කටයුතු කරන හැටියටත් පැහැදිලි කළ සේක. මෑණියන් හැර ඉතිරි පහළොස් දෙනම සක්කාය දිට්ඨිය නම් වූ මහා සංයෝජන බන්ධනය බිඳ දමා මම ය මගේ ය යන දෘෂ්ටියේ නිසරු බව පිරිසිඳ දැක සෝවාන් ඵලයට පත්වූහ. ඔවුන්ගේ සංසාර ගමන ආත්ම හතකට සීමා විය. පංච උපාදානස්කන්ධයේ යථාර්ථය දැනගෙන භව දුකින් මිදීමේ ස්ථිරසාර පිවිසුමට පත් වීමේ භාග්‍යය මොවුන් ලබා ගත්තේ පෙර පින් බලයෙන් බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාවට පාත්‍ර වීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

තමන් වහන්සේගේ කාර්යය නිමවා විහාරස්ථානයට වැඩම කළ බුදුරජාණන් වහන්සේගෙන් ආනන්ද හිමියෝ පාන්දරම ඔබ වහන්සේ කුමක් අරභයා වැඩි සේක් දැයි විමසූහ. ආනන්ද හිමියන්ට සියලු තතු පැවසීම බුදුරජාණන් වහන්සේගේ සමාන්‍ය සිරිත වූ නිසා ආනන්ද හිමියන්ට සමස්ත ප්‍රවෘත්තිය ම දන්වා සිටි සේක.

දම්සභා මණ්ඩපයෙහි රැස්ව සිටි මහා සංඝයා වහන්සේ වෙත ද පුවත සැල විය. බුදුරජාණන් වහන්සේ එතැනට වැඩම කර භික්ෂූන් කතා කරමින් සිටි කරුණ විමසා වදාළ විට බුදුරජාණන් වහන්සේ පාන්දරින් වැඩම කළ ගමන පිළිබඳ කතාබහ කරමින් සිටි බව භික්ෂූහු පැවසූහ. සංඝයා වහන්සේ බුදුරජාණන් වහන්සේගෙන් වැඩිදුරටත් විමසා සිටියේ ඒ මාතාව පමණක් සෝවාන් ඵලයෙහි නොපිහිටියේ කවර හෙයින්ද යන්නයි. ඇය සෝවාන් ඵලයට පත් වූයේ ඇගේ ළමා වයසේදී ම යැයි බුදුරජාණන් වහන්සේ මෙහිදී පැවසූහ.

එසේ සෝතාපන්න වූවකු නම් පාප ක්‍රියාවල යෙදෙන වැදි පුරුෂයකුගේ භාර්යා තනතුරට පත්වූයේ කවර හෙයින් දැයි අනතුරුව භික්ෂූහු ප්‍රශ්න කළෝ ය. සතුන් මැරීම වැනි පාප කර්මවලට ඇය උදව් දුන්නා නොවේ. ඇය අතින් ඉටු වූයේ සැමියාට අවශ්‍ය දේ සපයා දීම පමණි. උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය හා එය වැරැදි දැක්මක් විතරක් බව ඇය අවබෝධ කර අවසාන ය. ඒ නිසා ආර්ය ශ්‍රාවක වූ ඇය අතින් සතුන් මැරීම හෝ අඩු තරමින් ඒ සඳහා අනුබල දීමක් හෝ සිද්ධ වන්නේ නැතැයි සංඝයා වහන්සේ දැනුවත් කරමින් බුදුහු වදාළහ. අනතුරුව පහත සඳහන් ගාථාව දේශනා කරමින් තවදුරටත් කරුණු තහවුරු කළ සේක.

තුවාලයක් නැති අත්ලෙන් ගත් විෂ ශරීරයේ නොපැතිරෙන්නා මෙන් අකුසල් නොකරන්නාට පව් සිදු නොවේ යනුවෙන් ධම්මපදයේ සඳහන් වේ.

යමකු යම් ක්‍රියාවක් කළ පමණින්, චේතනාවක් නැත්තේ නම් පවක් සිද්ධ වන්නේ නැත. ක්‍රියාව කර්මය නොවන්නේ ය. කර්මය වන්නේ චේතනාව ම ය. දරුවන් යහමඟට ගැනීමේ අදහසින් මව්පියන් ඉතා තදින් සැරවැර කළත් දැනුවත් කළත් අභ්‍යන්තරයේ ඇත්තේ යහපත් සිතිවිල්ලක් නිසා අකුසලයක් සිද්ධ වීමට ඉඩක් නැත. සානුකම්පිතව යහපත උදෙසා කරන ලද ක්‍රියාවක් වුව ද මෙයින් අකුසලයක් වන්නේ නැත. කවර තරම් විෂ සහිත දෙඅත්ලෙහි තැවරුණත් එම විෂ ශරීරගත නොවන්නා සේ ය.

අයන්ති විතාන

## කරුණා කරමු මුනි සිරිපා



බුදු දම් සඟ ගුණ සිතේ දරාගෙන
සුමන සමන් දෙවි පිහිට පතාගෙන
සීත ගඟුල් දිය පහස ලබා ගෙන
අපිත් වඳිමු මුනි සිරිපා හැම දින

සුමන සමන් හැම දෙවි පිහිට පතා
යනෙන සෑමදෙනට ම මෙත් සරණ පතා
අයහපතක් නොව යහපත් වෙන්ට සිතා
මුනි සිරිපා නමදිමු අපි නිවන් පතා

සොඳුරු වන මැදින් සීතල පින්න යටින්
වලාකුළින් ගල් මතුපිට සිසිල මතින්
තුන් සරණින් සමන් දෙවිඳු පිහිට නිතින්
ලැබ කරුණා කරමු බුදුන් වැඳ දෝතින්

සීත ගඟුල් දිය සැම හට සිසිල සදා
ඈත පෙනෙන මනහර රූ සිතේ රඳා
දෑත නළල් තල රඳවා මුනිඳු පුදා
ගීත ගයමු මුනි සිරිපා බැතිනි පුදා

මුනි සිරිපා පහස ලැබූ ලක් දෙරණේ
සමන් දෙවිඳු රැකවරණයි නිති රැඳුණේ
නිවන් පතා කරුණාකර කඳු මුදුනේ
අපේ බුදුන් අපි වැන්දා මෙත් සරණේ

**අනිල් මනතුංග**
**ගොතටුව**

## ජන්ම දිනය ගැඹුරුම අරුතකි දෙන්නේ

යායට පිපුණ මල් ගොමුවල සුවඳ දැනේ
බලමින් ගලා යන සිසු දරුවනගෙ සෙනේ
අරුණැලි කහ පැහැය රැඳි අසපුවක වනේ
සමරමි හැත්තෑ නම වැනි මගෙ ජන්ම දිනේ

ගත සිත කිති කවන සීතල නළ පාවේ
කිචි බිචි කුරුලු නද සංගීතය ආවේ
වියපත් වීම දිවියක අනියත බාවේ
තුන්ලෝතිලක මහිමිගෙ සදහම සිහිවේ

හෙට මැරුණත් සැපයි අද ජොලියෙනි ඉන්නේ
මෙහෙමත් හිතන අය වෙති මොහඳුරු ගින්නේ
කති බොති නටති අප විමසිය යුතු වන්නේ
ජන්ම දිනය ගැඹුරුම අරුතකි දෙන්නේ

**මාහරගම පියරතන නා හිමි**
**ශ්‍රී පඤ්ඤානන්ද පිරිවෙන**
**මාහරගම ගිරිඋල්ල**




## මතක ඔස්සේ

බුදුන් දැකලා නිවන් දක්නට පින්පුරයි අපෙ මවුපියෝ
දවස් ගණනේ නිදිවරා අපට පණ දුන් මවුපියෝ
සුවෙන් සතපා අහර නොලබා අපට බත් දුන් මවුපියෝ
අසරණව අද අප දිහා බලා සිටිතී මවුපියෝ

ගිලන් වී ඇඳ මත ඉඳීවී
බෙහෙත් නොලබා දුක් විඳීවී
ගෙනා ආයුෂ ඉතා කෙටිවී
මැරෙණ මොහොතට ඉඳී ළංවී

දිලෙයි පුන්සඳ ඈත අහසේ
දූ පුතුන් හැර ගොසින් රහසේ
කවුලුවෙන් වැඩිහිටි නිවාසේ
ඈත බලතී මතක ඔස්සේ


**ගාමිණී ජයලත් තල්දෙන**

බණ පොතේ
බණ කතා
බණ මඩුවෙ
(සබ්බ රසො ධම්ම රසං)
සියලුම රස
පරදවා
දහම් රස
විමසයි

කලබල සත
පහන් වෙයි
සිතෙහි දුක්
නිවාලයි

බණ මඩුවෙ
බණට පැහැද
මහ මළුවෙ
පහන් සිළු
තාලයට
එහෙ මෙහෙ
සෙලවී සෙලවී
අලංකාර බව පෙන්වයි

**කෝට්ටපිටියේ පඤ්ඤසිරි හිමි**
**අශෝකාරාමය**
**දම්සෝපුර**




## මුනිඳුනි

නමදිමු අප බුදු සමිඳු
රුදු ඝොර මරුවා පැරදු
ඒ මග ගත්තොත් දැනුදු
බෝසත් දිවියක් පුබුදු

වැඳලා බුදු සමිඳු හට
මඟ යමු අප අරිය අට
සිතේ තිබෙන කෙලෙස් පට
මරු පරදා කරමු පිට

**අජිත් වික්‍රමනන්ද වීරසූරිය**
**මොරගොල්ල**
**ඉඹුල්ගස්දෙණිය**



## මොහඳුර දුරු කර

සදන කුළුණු දම් ගුණ පිරි වදන් සර
සිළුන සුසැදි ලිපි දිවි සිතු නදන් කර
සොබන මේ බුද්ධ ශ්‍රිය සොඳ පහන් තුර
දුදන ඉසි වැරෙන සැඩ සැරි දහන් කර

කිසි වර නොම වැදී ඉන් වැදුන ද නොසැලී
නිරතුරු සිටි දිදී ලොව දස අත නැණලී
පහකර සත බැඳී මෝ හතර අඳුර වැලී
බුදුසරණ පත් රැඳි දිගුකල් පවතිවා සුදලී

**අතුරුගිරියේ ධීරානන්ද හිමි**



## බුදුසරණ

බුදුසරණ පුවත් පතේ
සෑසි දහම ගැබ්ව ඇතේ
මුළුමනින් ම මගේ සිතේ
බුදුසරණට ඉඩක් ඇතේ

බුදුසරණ පුවත්පතේ
ඔවදන් සඟරුවනෙ වෙතේ
මුනි දහම ගැබ්ව ඇතේ
බුදුසරණ ම ගන්න පුතේ

**අජිත් වික්‍රමනන්ද වීරසූරිය**
**පොල්ගහවෙල**

## බුදුසරණ පහන් සිතක කවි

සම්පූර්ණ නම :- ..............................................................................
ලිපිනය :- ..............................................................................
දුරකථන අංකය :- ..............................................................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක
සතර පෝදටම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ.
ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න.
සංස්කාරිකා,පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.